www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

සිංහල I
சிங்களம் I
Sinhala I

71 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**
※ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) බුදුන් එසේ සිතා වදාළ සිතිවිල්ල හා සමඟ ම දෙව්බරණින් සැරහුණා වූ තුන්ගවු පමණ **අත්බැවින් අවුත්** විමනින් බැසපියා බුදුන් වැඳ එකත්පස් ව සිටියේය. බුදුහු දෙස් කියවන්නා සේ ඔහු ලවා කියවා ඔහු ලත් සම්පතත් පෑ සැක හරවනු පිණිස 'දෙවතාවා කුමන පින්කමක් කොට මේ දිවසැපත් ලද්දි දැ' යි විචාළසේක. දෙවතාවා ද 'අනික් පින්කමක් නොදනිමි. නුඹවහන්සේ කෙරෙහි සිත පහදවාගත් පින්කම්[න]. එයින් ලසු පින්කමක් නොවන හෙයින් මේ සම්පත් ලදිමි' බොහෝදෙනාට අස්වා කිවුය. බොහෝදෙනා දිව්‍යපුත්‍රයාත් ඔහුගේ සම්පතත් දැක 'අනේ බුදුන්ගේ පින්කෙත් ලෙසක් ඉතා විස්මය තියා ය. අනික් පින්කමක් නොකළ මට්ටකුණ්ඩලියා පවා බුදුන් කෙරෙහි සිත් පහදවාගත් පමණකින් මේ සා සම්පතක් ලැබපී ල' යි සතුටු ව පින්කම් කිරීමෙහි උත්සාහ ඇති වූහ.

(i) මෙහි සඳහන් පරිදි එකත්පස් ව සිටි තැනැත්තා කවරෙක් ද?
(ii) මට්ටකුණ්ඩලී දිව්‍යාත්මභාවයක් ලබා ගැනීම සඳහා කළ පින්කම කුමක් ද?
(iii) "එයින් ලසු පින්කමක් නොවන හෙයින් මේ සම්පත් ලදිමි" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**අත්බැවින් අවුත්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

www.alevelapi.com

(ආ) එවේලෙහි ජීවකයෝ **බිම හුණු** තෙලිත්ත හිඳනා දැක "මා කෙළේ කිම් ද? තෙල් බින්දුවට පවා මේ සා වූ ලෝභයක් කරන්නාහු මට දියයුතු කුලී කෙසේ නම් දීපියද්දැ" යි සිතසිතා කලකිරී සිටියහ. සිටුදේවි ජීවකයන් අදහස් දැන "පුත, කුමක් සිතා සිටිනේදැ" යි විචාළහ. ජීවකයෝ "දේවීන්වහන්ස, නුඹගේ සම්පත්ලෝභය සිතසිතා සිටියෙමි. මා අතින් බොහෝ ඖෂධ නසා මේ තෙල කකාළෙමි. බිම් වැගිර ගිය තෙලිත්තට නුඹවහන්සේ මෙසේ ලෝභ කල කෙසේ නම් මට මිල දෙනුයේ ද? මා අත තුබූ බෙහෙත් මඩුයෙනුත් නොවෙම් දෝ හෝයි සිතීමි" යි කීහ. එබසට සිටුදියණියෝ කියන්නාහු "පුතණ්ඩ, එසේ නොකිය. අපි උපයන අවස්ථාවෙහි මෙසේ සියුම්ව උපයන සේත් දනුම්හ. වියදම් කරන අවස්ථාවෙහි උදාර කොට දෙන සේත් දනුම්හ. අනාථයේ වල දමන සේ නොදනුම්හ. බිම හී ගිය තෙලිත්තෙන් කිසිවක්හට ප්‍රයෝජන නැත. පුළුනින් ගත් තෙලිත්ත පහනක් හෝ අවුළුවාලිය හැක්ක. නැතහොත් කන හෝ තබාගත හැක්ක. දුක්පත් කෙනකුන් අතපය ගාපිය හැක්ක. ඊට නුඹ නොසිතා කළමනා පිළියම් කරන්නැ" යි කීහ.

(i) ජීවකයන් දේවීන් වහන්සේගේ ක්‍රියාකලාපයෙහි දුටු විශේෂත්වය කුමක් ද?
(ii) තෙල් ස්වල්පයකින් වුව ද ගත හැකි ප්‍රයෝජන කීයක් මෙහි දක්වා තිබේ ද?
(iii) "අනාථයේ වල දමන සේ නොදනුම්හ" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**බිම හුණු**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඉ) එවිට එකියන ස්ත්‍රී මහත් කොට සිනා සී පුවාහ. ඊට ශක්‍රයෝ කියන්නාහු "මෙතන නැටීමක් ගී කීමක් කෙළි නළුවක් නැති ව මහත් කොට අස්ථානයේ සිනාසුණුයේ කුමකට දැ?" යි විචාළෝ ය. එවිට ස්ත්‍රිය කියන්නී "තොප කටින් ඩැ ගෙන ආ මාංශ කැටිය උකුසු ඩැ ගත, මත්ස්‍යයා දියට පැන පී ය. මේ කාරණය දැක සිනා සීමි" කිව. එවිට ශක්‍රයෝ කියන්නාහු "තොප මට සිනාසෙන්ට කාරණා කිම් ද? තොපගේ පළමු පිසවා කෑ සමුණනුත් නැති ව අලුත් සමුණනුත් නැති ව **උභය භ්‍රෂ්ට ව** ඉඳිනා තෙපි මට නින්දා කියා සිනාසෙන්නේ ය" යි ශක්‍රයෝ නින්දා කොට බිණූහ. ඊට ස්ත්‍රිය කියන්නී "පළමු මෙසේ වූ නොකටයුත්ත කොට මෙසේ වූ දුකකට පැමිණියෙමි. ඉනිබ්බේ පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ දෙයක් නො කරමි" කිව. ශක්‍රයෝත් "පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ නොකටයුත්තක් නො කරව" යි කියා අවවාද දී දෙව්ලොවට ගියාහ" යි වදාරා ...

(i) ශක්‍රයා සඳහන් කළ පරිදි සිනා සීමක් සිදු කළ හැකි අවස්ථා කීයක් මෙහි දක්වා තිබේ ද?

(ii) ශක්‍රයා ස්ත්‍රියට ලබා දුන් අවවාදය කුමක් ද?

(iii) "ඉනිබ්බේ පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ දෙයක් නො කරමි" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**උභය භ්‍රෂ්ට ව**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) එකෙණෙහි තමා පියාණන් පිටිපස්සෙහි උන්නාවූ ස්වර්ණතිලකා තොමෝ "උද්දාල බ්‍රාහ්මණයාණෝ නම් කවුරු දැ" යි විචාරා "තෙල **භද්‍රපීඨය** මත්තේ හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යැ" යි කී කල්හි තමාගේ නිලිපුල් පෙති දෙකක් හා සමාන නිර්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී, කොඳකැකුළු මෙන් සුදු සිනිඳු දත්පෙළෙහි මනහර සුදු රසින් භින්නවර්ණ වූ අතිරක්ත අධරයුග්මය පොපි දෙවා මඳ මඳ සිනා පහළ කෙරෙමින් උද්දාල බ්‍රාහ්මණයා මුහුණ බලා තමා පෙරව ගෙන උන් පළස මඳක් පහකොට ශරීරප්‍රභා විහිදුවාලුව. හිරුරැස් කලබක් වැනි ඒ ශරීරාලොකය දැක උද්දාල බ්‍රාහ්මණයා ඉතා ආශ්චර්යමත් ව කවර ආලොකයෙක් දො හොයි විස්මය පත් ව බලනුයේ ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතු ව මහත් වූ ශොකයෙන් දාහගත් ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු මුඛ නාසිකා හා කඳුලුධාරාවෙන් තෙත්වූ නෙත්‍ර ඇති ව විසංඥ විය.

(i) මේ පාඨයෙහි දෙනෙත් සහ දත් දෙපෙළ සමාන කොට ඇති වස්තු කවරේ ද?

(ii) ස්වර්ණතිලකාගේ ශරීරාලෝකය දැක්වීම සඳහා මෙහි යොදා ඇති උපමාව කුමක් ද?

(iii) "මහත් වූ ශොකයෙන් දාහගත් ශරීර ඇති ව" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**භද්‍රපීඨය**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(උ)
මෙලෙසින් නොයෙක ව    ර
දෙමවුපිය කී මෙහෙව    ර
නොකළහොත් අනද    ර
වෙතියි ඔහුගේ නුවණ නොසම    ර

හිමි තම නැණ නැ    වින්
සැදි ගී තරඟ බෙහෙ    වින්
වෙණ සිප් මහණ    වින්
කෙළේ ඔහු පරතෙරට මැන    වින්

(i) ගුත්තිල ඇදුරුතුමා මූසිලට වීණා ශිල්පය ඉගැන්වීමට තීරණය කළේ කවර හේතුවක් නිසා ද?

(ii) දෙ වන පද්‍යයෙහි අන්තර්ගත එක් රූපක අලංකාරයක් දක්වන්න.

(iii) "වෙණ සිප් මහණවින්" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**නොසමර**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

● (උ) සහ (ඌ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "මෙබඳු ස්ත්‍රීරත්නයෙකින් වියෝ ව ජීවත් වීමට වඩා මිය යාම යහපතැ."

(ii) "එම්බල බමුණ, අසන දෙයටත් වඩා දුටු දෙය ප්‍රත්‍යක්ෂ ය."

(iii) "මම තී පාදපරිචාරිකා කොට සොළොස් දහසක් පුරඟනාවන්ට අග මෙහෙසුන් කෙරෙමි."

(iv) "මෙතැන් පටන් නුඹවහන්සේ ද මාගේ පියාණන්වහන්සේ මය."

(v) "දැන් ඉතින් හඳේ පුර පැත්ත තමයි. මේ මහත්තයත් මට කතා කළා හේන් රැක බලා දෙන්ඩ අදේකට."

(vi) "ඕව මොකවත් හිතට මතට ගන්ඩ එපා ... මං හෙට පංසල් නොයා ඉන්ඩ තීරණේ කෙරුවා."

(vii) "මැණික නම් මැණික වේ<br>කිලුටු පස් යට තිබී ලැබුණ මුත්"

(ලකුණු $03 \times 4 = 12$ යි.)

(ඌ) පහත සඳහන් පද්‍ය පන්තියේ භාෂා භාවිතය හා කාව්‍ය ආකෘතිය පිළිබඳ අවධානය යොමු කරමින් රසාස්වාදයක් කරන්න.

**අඳුර අපේ දුක නිවාවි**

යමන් කළුවෙ ගෙදර යන්න, කන්ද උඩින් අඳුර එනව
උඹට වගේ මගෙ ඇඟටත් හරි ම මහන්සිය දැනෙනව

අඳුර තමයි අපෙ ඇඟපත නිවන්න දෙවියෝ එව්වේ
හනික යමන් ගාල් වෙන්න පිදුරු ගොඩේ ගෙයි මුල්ලේ

උදේ හිටන් අව් කට්ටේ උඹව තියන් මැඩවෙච්චට
උඹේ හිතට අමාරු දැයි කියාපන්කො දැන්වත් මට
කරුමෙ තමයි පළිසන් දෙන්නේ අපගේ මේ විදියට
බුදුහාමුදුරුවො කිව්වේ ඒක තමයි දුක නිවන්ට

ගෙදර ගිහින් ඇළ ගාවින් හොඳ තණකොළ ටිකක් උඹට
තලු ගහ ගහ බඩ පිරෙන්න ගෙනැත් දාන්නම් කන්නට
දෙයියො තමයි අඳුර දුන්නෙ අපෙ ඇඟපත ගිනි නිවන්ට
හනික යමන් ගාල් වෙලා අඳුරු රෙද්ද පෙරව ගන්ට

මගේ කකුලෙ කටු ඇනිලා, ඉවසන්නට බැහැ රිදේවි
අන්දකාරෙ තෙල් ගාලා ඒ විස කටු ඇද දමාවි

හැන්දෑවට උඹ ඉඳගෙන තලු ගහනව මට ඇහෙනව
උඹට කළුවෙ, හුඟක් හොර ද හැන්දෑවට නින්ද යනව
අඳුර ඇවිත් මගෙ නළලට නම් මන්තරයක් කියනව
ඒ එක්ක ම ඇහැ පියවිල එළි වෙන තුරු නින්ද යනව

දෙයියො තමයි අඳුර දුන්නෙ අපෙ ඇඟපත නිවා ලන්ට
යමන් කළුවෙ ගාල් වෙලා, එකට වැටී නිදා ගන්ට

තුනාටිය මගෙ කක්කියනව බොහොම නොසෑහෙන විදියට
අඳුර හන්දි තෙල් ගාලා අත ගාවිය එය හෙමිහිට

අඳුර රෙද්ද පෙරවාලා අපෙ ඇඟපත නිදි කරාවි
අඳුර අපේ දුක නිවලා දාහක් ගින්දර නිවාවි

(ලකුණු 12 යි.)

[හතරවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**2.** (අ) "ජීවිත පරිඥානයක් ඇති ලේඛකයා මානව චර්යාධර්ම ආශ්‍රය කොට ගෙන මනා ලෙස චරිත නිරූපණයෙහි යෙදෙයි" සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමසන්න.

**නැත හොත්**

(ආ) ජාතක කථාවල සංදර්භීය ලක්ෂණ කෙටියෙන් දක්වා, ජාතක කථා මගින් මිනිස් සිතෙහි සැඟවුණු තැන් විවර කොට පෙන්වන ආකාරය නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**3.** පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

(අ) කුරුණෑගල සහ ගම්පළ සාහිත්‍ය අවධිවල රචනා වූ ගද්‍ය නිර්මාණ අතුරෙන් **තුනක්** පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 07 යි.)

(ආ) කිසියම් වෘත්තාන්තයක ප්‍රධාන සිද්ධි හඳුනාගෙන ඒවා පුළුල් ලෙස විස්තර කරමින් ශ්‍රාවකයාට ප්‍රයෝජනවත් කථාවක් ඉදිරිපත් කොට ඇති ආකාරය සද්ධර්මාලංකාරයේ නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න.

**නැත හොත්**

"පූජාවලිය ජනප්‍රිය ගද්‍ය කාව්‍යයක් වන්නේ ජනකාන්ත කථාන්තර කලාවක් අනුගමනය කිරීම නිසා ය" මේ අදහස නිර්දිෂ්ට කථාවලින් ගත් නිදසුන් සහිත ව විමර්ශනයට ලක් කරන්න. (ලකුණු 08 යි.)

**4.** "ගුත්තිල කාව්‍යයේ කථා ශරීරයත් වර්ණනාත් අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී" යටත් පිරිසෙයින් වර්ණනා **තුනක් වත්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**5.** "බැද්දේගම ජන ජීවිතය ඛේදවාචකයක් බවට පත් වූයේ බලවතුන් විසින් දුබලයන් පෙළීමට ගන්නා ලද උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි" යෝග්‍ය නිදසුන් මගින් මේ අදහස විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

**6.** සමකාලීන සමාජ ගැටලු නිරූපණයෙහි ලා කෙටිකතා රචකයා දක්වන සාමර්ථ්‍යය නිර්දිෂ්ට කෙටිකතා **තුනක් වත්** ආශ්‍රයෙන් විග්‍රහ කරන්න. (ලකුණු 15 යි.)

**7.** නිර්මාණාත්මක හැකියාව හා භාෂා භාවිතය අතින් නිදහස් කවීන් දැක්වූ සාමර්ථ්‍යය අභිමත කවීන් **තිදෙනෙකුගේ** නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**8.** "උද්දාල බ්‍රාහ්මණයා ස්වකීය විනාශය තමා විසින් ම කැඳවා ගන්නා ලද්දේ තම සිතැඟි පාශයෙහි ගොදුරක් වීම හේතු කොට ගෙන ය" නිදසුන් **තුනක් වත්** ඇසුරෙන් විග්‍රහ කරන්න. (ලකුණු 15 යි.)

www.alevelapi.com

***

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිසා වූ කලි ශාරීරික හැඩය හා සමාජීය උරුමය අතින් අන්‍ය සත්ත්වයන්ට වෙනස් ස්වරූපයක් ගන්නා බව කිව යුතු යි. අප ලබන සමාජීය උරුමය සංස්කෘතිය වශයෙන් සඳහන් කළ හැකි ය. ඕනෑ ම කෙනෙකුගේ ජීවිත ඉතිහාසය වනාහි, ස්වකීය සමාජ පරිසරයේ සම්ප්‍රදායානුකූල ව පැවත ආ ගති පැවතුම්, සිරිත් විරිත් ආදිය තම ජීවන පිළිවෙළට ඇබ්බැහි කර ගැනීමේ මූලික ක්‍රියාමාර්ගයක් හැටියට දැක්විය හැකි ය. යම් කෙනෙකු කිසියම් සමාජයක උපන් මොහොතේ සිට, ඒ සමාජයේ සිරිත් විරිත් හා අදහස් උදහස් ආදිය ඔහුගේ අද්දැකීම් හා ගති පැවතුම් කෙරෙහි මහත් සේ බල පාන බව කිව යුතු යි.

මේ සමාජ සංස්කෘතිය විවිධ අංගයන්ගෙන් සමන්විත වූවකි අප පැරණියන්ගෙන් ලබා ඇති බඩුමුට්ටු, ද්‍රව්‍ය, ක්‍රම, න්‍යාය, අදහස් උදහස්, ගති පැවතුම්, භාෂා, කලා ශිල්ප, ගොඩනැගිලි ජාතික අගයයන් ආදිය එයට ඇතුළත් වෙයි. මේවා වූ කලි සංස්කෘතික අත්පත් කර ගැනීම්වල බාහිර මූර්තීන් හැටියට පිළිගත යුතු යි. කිසියම් මනුෂ්‍ය වර්ගයකගේ සංස්කෘතික දියුණුව සමාජයට විදහා දක්වන්නේ මේ මූර්තීන් බව කිව යුතු යි. අනුරාධපුරය, පොළොන්නරුව ආදි ස්ථානයන්හි ඇති ථූප, පිළිම, ගොඩනැගිලි, කලාකෘති ආදි නිර්මාණ සිංහල වර්ගයාගේ පැරණි සංස්කෘතික දියුණුව ලොවට විදහා දක්වන සංකේත වේ මේ භෞතික සංස්කෘතිය අපේ වර්තමාන හා අනාගත පරපුර හැඩ ගැස්වීම සම්බන්ධයෙන් ආධාර කර ගත යුතු වැදගත් ජාතික සම්පතක් වශයෙන් සැලකිය යුතු යි. ඒ නිසා අපේ මේ පැරණි ජාතික සංස්කෘතිය පිළිබඳ සෑහෙන මනා අවබෝධයක් බාල පරම්පරාව කෙරෙහි ඇති කර ලීම වැඩිහිටි ගුරු දෙගුරුන් කෙරෙහි පැවරී ඇති මහත් ජාතික වගකීමකි. අධ්‍යාපන කාර්යයේ දී, දරුවා, ඔහුගේ ජාතික සංස්කෘතිය, සමාජ පරිසරය යන මේ සියල්ලක් ම හා සමග දැඩි සේ අන්‍යෝන්‍ය සම්බන්ධයකින් වෙළී ඇති බව මෙනෙහි කළ යුතු යි මෙලෙසින් සලකන කල අධ්‍යාපන කාර්යය පැහැදිලි වශයෙන් ම සංස්කෘතික කාර්ය මාර්ගයක් හැටියට පෙනී යනු ඇත. මේ කාර්යය වූ කලි අවස්ථා හෙවත් අංශ තුනකින් සමන්විත වූවක් හැටියට දැක්වීමට පුළුවන. එනම්, සංස්කෘතික සංරක්ෂණය, පරිග්‍රහණය හා සංස්කරණය යි. මෙයින්, පරිග්‍රහණය හෙවත් ජාතික සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් හා ඇල්මක් දරුවා කෙරෙහි ඇති කරවීම විශේෂයෙන් ම වැදගත් ය. මේ කාර්යය ඉටු කර ලීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති සමාජ සංස්ථාවන් අතුරෙන් ඉතාමත් ම වැදගත් සංස්ථාව පාසල යි. සංස්කෘතියක් වූ කලි කලින් කලට වෙනස් වනසුලු දෙයකි. එහෙයින්, සංස්කෘතික සංස්කරණය කෙරෙහි ද සමාජයේ හිත යොමු කර ලිය යුතු ය. ඒ සමග ම ස්වකීය ජාතික සංස්කෘතිය කෙරෙහි අන්ධ වූ භක්තියකින් විරූපී වූ දර්ශනයකින් නොබැලීමට හැම කෙනෙකු විසින් ම වග බලා ගත යුතු වන්නේ ය.

(i) පුද්ගලයෙකුගේ ජීවිත ඉතිහාසය ලේඛකයා විසින් අර්ථකථනය කරනු ලැබ ඇත්තේ කෙසේ ද?

(ii) වැදගත් ජාතික සම්පතක් වශයෙන් මෙහි සැලකෙන්නේ කුමක් ද?

(iii) සංස්කෘතික සංස්කරණය කෙරෙහි අවධානය යොමු කළ යුතු වන්නේ කුමක් නිසා ද?

(iv) කිසියම් මනුෂ්‍ය වර්ගයකගේ සංස්කෘතික දියුණුව සමාජයට විදහා දක්වන්නේ කවරක් මගින් ද?

(v) වැඩිහිටි ගුරු දෙගුරුන් කෙරෙහි පැවරී ඇති ජාතික වගකීම කුමක් ද?

(vi) සංස්කෘතික පරිග්‍රහණය පිළිබඳ අවබෝධයක් ඇති කරවීමට පිහිටුවා ඇති සමාජ සංස්ථාව කුමක් ද?

(ලකුණු $02 \times 6 = 12$ යි.)

[පස්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ව්‍යාපාරයක් යනුවෙන් අදහස් කෙරෙන්නේ කිසියම් සමාජයක වෙසෙන මානව ප්‍රජාවට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා සපයමින් ලාභයක් ඉපැයීමේ අරමුණු සහිත ව පිහිටුවා ගැනෙන ආයතනයක් නැතහොත් කණ්ඩායමකි. ව්‍යාපාරයක ඉලක්කගත පිරිස හෙවත් කණ්ඩායම වන්නේ පාරිභෝගිකයෝ ය. ව්‍යාපාරයක් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරන්නේ අදියර දෙකකිනි. ඉන් එකක් වන්නේ පාරිභෝගිකයන්ගේ කෙටිකාලීන අවශ්‍යතා ඉටු කිරීම ය. අනෙක වන්නේ පාරිභෝගිකයන්ගේ දීර්ඝකාලීන අවශ්‍යතා ඉටු කිරීම ය. මේ ව්‍යාපාර එකකට එකක් වෙනස් ස්වරූප ගනී. ඒ වෙනස් ස්වරූප හට ගැනෙන්නේ ව්‍යාපාරය විසින් පාරිභෝගික පිරිස හෙවත් ඉලක්කගත කණ්ඩායම සඳහා සපයනු ලබන භාණ්ඩ හා සේවා පදනම් කොට ගෙන ය. සන්නිවේදනය යනු ව්‍යාපාරයක් හා අත්‍යන්තයෙන් ම සම්බන්ධ වන තවත් සංරචකයකි. ව්‍යාපාරයක් විසින් ඒකීය ඉලක්කගත කණ්ඩායම වෙත තම ව්‍යාපාරයේ භාණ්ඩ හෝ සේවා හෝ පිළිබඳ ව දැනුවත් කිරීමට යොදා ගනු ලබන්නේ සන්නිවේදනයේ ප්‍රමුඛාංගයක් වන වෙළෙඳ දැන්වීම් ය. පාරිභෝගිකයන් ද තමාට අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් පවතින ව්‍යාපාරික ආයතන පිළිබඳ ව දැනුවත් වන්නේ වෙළෙඳ දැන්වීම් ඔස්සේ ය.

ව්‍යාපාර ආයතනයක පැවැත්ම සඳහා විධිමත් වූ ද සංවිධානාත්මක වූ ද සන්නිවේදන ක්‍රමෝපාය අවශ්‍ය වේ. සන්නිවේදන ක්‍රමෝපාය නිර්මාණය විය යුතු වන්නේ එක් එක් ආයතනයේ අනන්‍යතාව ප්‍රකාශ වන ආකාරයට ය. එමගින් පාරිභෝගිකයන්ගේ ඉල්ලුම හා භාණ්ඩ හා සේවා සම්බන්ධ චර්යාවන් සකස් කෙරෙයි. ව්‍යාපාරික ආයතනයට ඉහළ ලාභයක් උපයා ගැනීමට ද අවකාශ සැලසෙයි. ඇතැම් වෙළෙඳ ව්‍යාපාරවල භාණ්ඩ හා සේවා පිළිබඳ ව පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා සකසා ඇති වෙළෙඳ දැන්වීම් ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඇතැම් පාර්ශ්වවලට හානිකර අන්දමින් නිර්මාණය වී තිබේ. එබැවින් ව්‍යාපාරික ආයතන ස්වකීය වෙළෙඳ දැන්වීම් නිර්මාණය කිරීමේ දී මෙරට සංස්කෘතියට හානිකර නොවන ආකාරයටත් පාරිභෝගිකයා නොමග නොයවන ආකාරයටත් ඒවා නිර්මාණය කළ යුතු ය.

(ලකුණු 13 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) බුද්ධි ගලනය හා ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග
(ii) ලෝක බලවතුන්ගේ යුද ගැටුම් හමුවේ පීඩාවට පත් වන ළමා පරපුර
(iii) ශ්‍රී ලංකාවට කෘත්‍රිම බුද්ධිය (AI - Artificial Intelligence) හඳුන්වා දීමේ යෝග්‍ය/අයෝග්‍යතාව
(iv) පොතපත කියවීමේ රුචිය මෙරට තරුණ ප්‍රජාව අතර නගා සිටුවීමට භාවිත කළ හැකි ක්‍රමෝපාය
(v) වැසි ජලය සංරක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ සාම්ප්‍රදායික ජල සංරක්ෂණ විධික්‍රමවලින් ලැබිය හැකි පිටිවහල

(ලකුණු 25 යි.)

www.alevelapi.com

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) ලේඛකයා හෝ ලේඛිකාව පොතක් රචනා කරන්නේ ය.
(ii) නැන්දා ද මාමා ද මල්ලී ද මම ද උත්සවයට යන්නෙමි.
(iii) ගුණපාල නම් ගොවියා මම ය.
(iv) අනාගත නායකයන් රටට හිතැත්තෝ වෙත්වා!
(v) අධිෂ්ඨානශීලීහු ජයග්‍රාහකයෝ වෙති.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) අමාත්‍යාංශ නිලධාරීහු සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළහ.
(ii) ව්‍යාකරණඥයෝ වාක්‍ය රීතීන් උල්ලංඝනය නො කරති.
(iii) ගුරුවරු ශිෂ්‍යයන් ලවා අභ්‍යාස ලියවති.
(iv) තරග තීරකයෝ දෙවෙනි වටය සඳහා තොප තෝරා ගත්හ.
(v) අගමැතිනිය එකී සමුළුවට නියෝජිතවරියක යැව්වා ය.

[හයවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (කෙනෙක්/කෙනකු) පුරන් වූ කුඹුරු ඉඩම් (අස්වද්දති/අස්වද්දයි).

(ii) මාර්ටින් වික්‍රමසිංහ (සූරීන්/සූරීහු) ගම්පෙරළිය රචනා (කළහ/කළේ ය).

(iii) දක්ෂ (දරුවන්/දරුවෝ) රට හැර යද්දී (දේශමාමකයෝ/දේශමාමකයන්) කඳුළු සලති.

(iv) ප්‍රකට (නාට්‍යකරුවක/නාට්‍යකරුවෙක්) වූ ජැක්සන් ඇන්තනි චතුර (නිවේදකයෙක්/නිවේදකයකු) ද වූයේ ය.

(v) (අපි/අප) දිස්ත්‍රික් තරගයෙන් ජයග්‍රහණය (කරාවි/කරති).

(ලකුණු 05 × 3 =15 යි.)

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත** පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **අධිකතර** ආශාවෙන් **පෙළෙන** මිනිස්සු **තෘෂ්ණාධිකයෝ** ය.
(**අධිකතර** - තද්ධිත, **පෙළෙන** - කෘදන්ත, **තෘෂ්ණාධිකයෝ** - සන්ධි)

(ii) **මදපවන්** වැද ලෙලෙන පහන්සිලු **මෙන්** රඟන **වරගනන්**
(**මදපවන්** - සමාස, **මෙන්** - නිපාත, **වරගනන්** - සන්ධි)

(iii) **ප්‍රබල** රාජ්‍යයන්හි **නායකයෝ** ද ස්වාභාවික විපත්තිවලට මුහුණ **දී** සසල වෙති.
(**ප්‍රබල** - උපසර්ග, **නායකයෝ** - විභක්ති, **දී** - ක්‍රියා)

(iv) **අනෞචිත්‍යය** තරම් **කාව්‍යරසය** විනාශ වීමට හේතු වන කාරණයක් නැත්තේ **ම** ය.
(**අනෞචිත්‍යය** - සමාස, **කාව්‍යරසය** - සමාස, **ම** - නිපාත)

(v) **ළමුන්ගේ** අයිතීන් **සුරකිනුව විධිමත්** ක්‍රියාමාර්ග ගෙන ඇත.
(**ළමුන්ගේ** - විභක්ති, **සුරකිනුව** - ක්‍රියා , **විධිමත්** - තද්ධිත)

(ලකුණු 03 × 5 =15 යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) මානව ...................... සංවර්ධනයට මග පෙන්වීම ආගමික නායකයන්ගේ කාර්යභාරයකි.

(ii) ...................... දෙපස පිහිටි මුඩුක්කු ගෙවල් පෙළ ජලයෙන් යට වූයේ ය.

(iii) ...................... සංචාරයකින් පසු ඒ මහා නෞකාව වරාය වෙත සේන්දු විය.

(iv) මුතු වන් සුදු වැලි තලාවෙන් ...................... තීරය ශෝභා සම්පන්න විය.

(v) රංගන ක්ෂේත්‍රයෙහි ...................... කලක් රැඳී සිටීමට ඈ සමත් වූවා ය.

(vi) උතුම් ...................... රැකගත් දරුවා ගුරු ඔවදන් ගෞරවයෙන් පිළිපදියි.
(දිගු, ගුණධර්ම, දීර්ඝ, ගංගා, ගුණදහම්, ගඟ)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) අත් + දෙක (ii) මුව + අගින් (iii) වල් + අම්බලම

(iv) නඳුන් + උයන (v) වස්තු + උපමා (vi) රංග + අවතරණය

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **ගොපල්ලා කෙවිටෙන්** ගොනාට පහර දුන්නේ ය.

(ii) **මගිය**, වහා **මාර්ගයෙන්** ඉවත් වනු.

(iii) මම **වැවෙහි** පිපී තිබුණු **නෙළුම්මල්** කැඩුවෙමි.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

[හත්වැනි පිටුව බලන්න.

www.alevelapi.com
උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

අහා ඒ ආශ්චර්යවත් රාත්‍රිය මනරම් ය; විචිත්‍රවත් ය ශෝභමාන ය දර්ශනීය ය. ප්‍රධාන ආරාධිතයා මා අසලට පැමිණ සුබ පතා සාහිත්‍ය ත්‍යාගය ද පිරිනමා බැහැර ගියේ ය. මෙවැනි උත්කර්ෂවත් උත්සවයක් කවර කලෙක වී ද

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "අපි යහළුවන් සමග විදේශ ගත වෙමු"යි තරුණයෝ ප්‍රකාශ කළහ.

(ii) "දරුවනි, හෙට පාසලට නො එන්න"යි ගුරුතුමා පැවසී ය.

(iii) "මම තරගයෙන් ජයග්‍රහණය කරමි"යි අමිල කී ය.

(ලකුණු $01 \times 3 = 03$ යි.)

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**කැලණිතිස්ස** රාජ්‍ය සමයේ දී මහා සාගරය ගොඩ ගැලීමට පටන් ගත්තේ ය. භීතියට පත් වූ රජතුමා ප්‍රධාන උපදේශකයා **කැඳවා** මෙයට කුමක් කළ යුතු දැ යි විමසී ය. රජතුමාගේ දේවී නම් වූ එක ම කුමරිය මුහුදට බිලි දිය යුතු බව ඔහුගේ නිගමනය විය. ඒ **කුමරිය** රූමත් ය; ගුණවත් ය; බුද්ධියෙන් පිරිපුන් ය. රජතුමා ඇය කැඳවා මුහුදට බිලි වීමට **කැමති** දැයි විමසුවේ ය. එය ඇසූ කුමරිය "පිය රජතුමනි, රට ජාතිය, ආගම වෙනුවෙන් මම මාගේ ජීවිතය වුව ද පරිත්‍යාග කරමි"යි පැවසුවා ය. ඇයගේ මෙ වදන් ශ්‍රවණය කළ රජතුමා අතිශය ප්‍රීතිමත් භාවයට පත් වූයේ ය. කුමරිය සර්වාභරණයෙන් විභූෂිත **කොට** නැවක නංවා මුහුදට බිලි **කළේ ය.** ආශ්චර්යයකි, මුහුද නිශ්චල වූයේ ය. ජලය ගොඩ ගැලීම නතර විය. මේ නෞකාව ගසා ගෙන ගොස් ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූ රෝහණ දේශයේ කිරින්ද නම් වූ ස්ථානයට ගොඩ ගැසුවේ ය. එකල එහි රාජ්‍ය පාලකයා වූ **කාවන්තිස්ස** ඇය තම අගබිසෝ පදවියෙහි පිහිටවූයේ ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.

(ii) මෙහි ඇති අතීත කෘදන්ත පද **තුනක්** උපුටා දක්වන්න.

(iii) මෙහි තිබෙන අස්ත්‍යර්ථයේ තද්ධිත පද **තුනක්** උපුටා දක්වන්න.

(iv) දේවී, බුද්ධියෙන්, පිරිපුන් යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(v) මෙහි තිබෙන ඝෝෂ මහාප්‍රාණ අක්ෂර **තුනක්** ලියන්න.

(ලකුණු $03 \times 5 = 15$ යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) සර්ව නාම පද

(ii) සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය

(iii) පූර්ව රූප සන්ධිය

(iv) විධි ක්‍රියාව

(v) ස්වාර්ථයේ තද්ධිත පද

(ලකුණු $05 \times 3 = 15$ යි.)

* * *

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2023(2024)

# 71 - සිංහල

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2023 (2024)

## 71 - සිංහල I

## ලකුණු බෙදී යාම

## I පත්‍රය

මේ ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

**පළමු ප්‍රශ්නය :-** මේ ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) යනුවෙන් කොටස් හතකින් (07) සමන්විත ය.

- (අ), (ආ), (ඉ), (ඊ), (උ) අවබෝධය - ලකුණු 16 යි (4 x 4 = 16)
  (මේ කොටස් පහෙන් සතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

- (ඌ) අවස්ථා සම්බන්ධය - ලකුණු 12 යි (3 x 4 = 12)
  (i, ii, iii, iv,v, vi, vii මේ කොටස්වලින් අවස්ථා සතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

- (එ) රසාස්වාදය - ලකුණු 12 යි.

**ලකුණු 40යි.**

අංක 02 සිට 08 තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරෙන් සතරකට (04) පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60කි. (3 වන ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකි. (අ) කොටසට ලකුණු 07කි. (ආ) කොටසට ලකුණු 08කි.)

# උත්තර පත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තර පත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තර පත්‍ර ලකුණු කිරීමට රතු පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තර පත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනුකොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................
........................................ ✓ △ $\frac{4}{5}$
........................................

(ii) ........................................
........................................ ✓ △ $\frac{3}{5}$
........................................

(iii) ........................................
........................................ ✓ △ $\frac{3}{5}$
........................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

## බහුවරණ උත්තර පත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තර පත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස් ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැණි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නො ලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තර පත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

## අභිමතාර්ථ

### I පත්‍රය

අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන් සතු ව පවතින:

- සම්භාව්‍ය සිංහල (නිර්දිෂ්ට) ගද්‍ය හා පද්‍ය කෘති කියවා අවබෝධ කර ගැනීමේ ශක්‍යතාව හඳුනා ගැනීම ද
- නූතන ගද්‍ය-පද්‍ය හා කාව්‍ය නිර්මාණ රස විඳීම හා තදනුබද්ධ විචාරාත්මක දෘෂ්ටිය කෙබඳු දැයි හඳුනා ගැනීම ද
- කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන රස විඳීම හා විචාරය කිරීමේ ශක්‍යතාව මැන බැලීම ද මේ පත්‍රයෙන් අපේක්ෂිත ය.

**1.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) බුදුන් එසේ සිතා වදාළ සිතිවිල්ල හා සමඟ ම දෙව්බරණින් සැරහුණා වූ තුන්ගවු පමණ **අත්බැවින් අවුත්** විමනින් බැසපියා බුදුන් වැඳ එකත්පස් ව සිටියේය. බුදුහු දෙස් කියවන්හා සේ ඔහු ලවා කියවා ඔහු ලත් සම්පතත් පැ සැක හරවනු පිණිස 'දෙවතාවා කුමන පින්කමක් කොට මේ දිව සැපත් ලද්දී දැ' යි විචාළසේක. දෙවතාවා ද 'අතික් පින්කමක් නොදනිමි. නුඹවහන්සේ කෙරෙහි සිත පහදවාගත් පින්කම්|හා|. එයින් ලසු පින්කමක් නොවන හෙයින් මේ සම්පත් ලදිමී' බොහෝදෙනාට අස්වා කිවුය. බොහෝදෙනා දිව්‍යපුත්‍රයාගේ ඔහුගේ සම්පතත් දැක 'අපෙ බුදුන්ගේ පින්කෙත් ලෙසක් ඉතා විස්මය තියා ය. අතික් පින්කමක් නොකළ මට්ටකුණ්ඩලියා පවා බුදුන් කෙරෙහි සිත් පහදවාගත් පමණකින් මේ සා සම්පතක් ලැබුයී ල' යි සතුටු ව පින්කම් කිරීමෙහි උත්සාහ ඇති වූහ.

(i) මෙහි සඳහන් පරිදි එකත්පස් ව සිටි තැනැත්තා කවරෙක් ද?

(ii) මට්ටකුණ්ඩලී දිව්‍යාත්මභාවයක් ලබා ගැනීම සඳහා කළ පින්කම කුමක් ද?

(iii) "එයින් ලසු පින්කමක් නොවන හෙයින් මේ සම්පත් ලදිමී" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**අත්බැවින් අවුත්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා/මටකොඩොල් දෙව් පුත් / දිව්‍ය පුත්‍රයා/ දෙව් පුත් /මට්ටකුණ්ඩලී කිව්වොත් දෙන්න එපා X

ii. බුදුන්වහන්සේ කෙරෙහි සිත පහදවා ගැනීම (මේ පිළිතුරම තිබිය යුතුයි.)

iii. එයත් සැහැල්ලු /කුඩා /පුංචි/සුළු/සරල පින්කමක්/කෙටි පුණ්‍යකර්මයක් නොවන නිසා මෙබඳු වූ (දිව්‍ය) සම්පත් (දිව) සැපත ලැබුවෙමි/ලබා ගත්තෙමි. (ලඝු X)

iv. ආත්මභාවයෙන් පැමිණ/ශරීරවත් ව පැමිණ / ශාරීරික වශයෙන් පැමිණ

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

(ආ) එවේලෙහි ජීවකයෝ **බිම හුණු** තෙලිත්ත හිඳනා දැක "මා කෙළේ කිම ද? තෙල් බින්දුවට පවා මේ සා වූ ලෝභයක් කරන්නාහු මට දියයුතු කුලී කෙසේ නම් දීපියද්ද" යි සිතසිතා කලකිරී සිටියහ. සිටුදේවි ජීවකයන් අදහස් දැන "පුත, කුමක් සිතා සිටිනේදැ" යි විචාළහ. ජීවකයෝ "දේවීන්වහන්ස, නුඹගේ සම්පත්ලෝභය සිතසිතා සිටියෙමි. මා අතින් බොහෝ ඖෂධ නසා මේ තෙල කකාළෙමි. බිම වැගිර ගිය තෙලිත්තට නුඹවහන්සේ මෙසේ ලෝභ කල කෙසේ නම් මට මිල දෙනුයේ ද? මා අත තුබූ බෙහෙත් බඩුයෙනුත් නොවෙමි දෝ හෝයි සිතීමි" යි කීහ. එබසට සිටුදියණියෝ කියන්නාහු "පුතණ්ඩ, එසේ නොකිය. අපි උපයන අවස්ථාවෙහි මෙසේ සියුම්ව උපයන සේත් දනුම්හ. වියදම් කරන අවස්ථාවෙහි උදාර කොට දෙන සේත් දනුම්හ. අනාථයේ වල දමන සේ නොදනුම්හ. බිම හී ගිය තෙලිත්තෙන් කිසිවක්හට ප්‍රයෝජන නැත. පුළුනින් ගත් තෙලිත්ත පහනක් හෝ අවුළුවාලිය හැක්ක. නැතහොත් කන හෝ තබාගත හැක්ක. දුක්පත් කෙනකුන් අතපය ගාපිය හැක්ක. ඊට නුඹ නොසිතා කළමනා පිළියම් කරන්නැ" යි කීහ.

(i) ජීවකයන් දේවීන් වහන්සේගේ ක්‍රියාකලාපයෙහි දුටු විශේෂත්වය කුමක් ද?

(ii) තෙල් ස්වල්පයකින් වුව ද ගත හැකි ප්‍රයෝජන කීයක් මෙහි දක්වා තිබේ ද?

(iii) "අනාථයේ වල දමන සේ නොදනුම්හ" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**බිම හුණු**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. සම්පත් කෙරෙහි ඇති විෂම ලෝභය(ලෝභී ස්වභාවය/ලෝභකම) / සම්පත් ලෝභය

3 කි. පහන් දල්වීමට , කන හෝ තබාගැනීමට, දුක්පත් කෙනෙකුගේ අතපයවල ගෑමට

ii. ප්‍රයෝජන තුනකි. ( ප්‍රයෝජන තුන දක්වා තිබුණ ද ලකුණු ලබා දෙන්න.)

නිකරුණේ

iii. නිකරුණේ /අහේතුක ව ඉවත දමන හෙවත් නිෂ්ඵල ලෙස කැලයට දමන / විනාශ කරන ආකාරය නො දනිමු. පිළිසරණක් නැතුව X නිරර්ථ X

iv. බිමට වැටුණු / බිමට පතිත වූ බිමට ගලා ගිය X

හී > හෙයි > හුණු - භූත කෘදන්ත

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

(ඉ) එවිට එකියන ස්ත්‍රී මහත් කොට සිනා සී පුවාහ. ඊට ශක්‍රයෝ කියන්නාහු "මෙතන නැටීමක් ගී කීමක් කෙළවක් නැති ව මහත් කොට අස්ථානයේ සිනාසුණුයේ කුමකට ද?" යි විචාළෝ ය. එවිට ස්ත්‍රිය කියන්නී "තොප කටින් ඩැ ගෙන ආ මාංශ කැටිය උකුසු ඩැ ගත, මත්ස්‍යයා දියට පැන පී ය. මේ කාරණය දැක සිනාසීමි" කිව. එවිට ශක්‍රයෝ කියන්නාහු "තොප මට සිනාසෙන්ට කාරණා කිම් ද? තොපගේ පළමු පියවා සමුණනුත් නැති ව අලුත් සමුණනුත් නැති ව **උභය භ්‍රෂ්ට ව** ඉඳිනා තෙපි මට නින්දා කියා සිනාසෙන්නේ ය යි ශක්‍රයෝ නින්දා කොට බිණූහ. ඊට ස්ත්‍රිය කියන්නී "පළමු මෙසේ වූ නොකටයුත්ත කොට මෙසේ වූ දුකකට පැමිණියෙමි. ඉනිබ්බේ පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ දෙයක් නො කරමි" කිව. ශක්‍රයෝත් "පතිව්‍රතා ධර්ම විනා මෙසේ වූ නොකටයුත්තක් නො කරව" යි කියා අවවාද දී දෙව්ලොවට ගියාහ" යි වදාරා ...

(i) ශක්‍රයා සඳහන් කළ පරිදි සිනා සීමක් සිදු කළ හැකි අවස්ථා කියක් මෙහි දක්වා තිබේ ද?

(ii) ශක්‍රයා ස්ත්‍රියට ලබා දුන් අවවාදය කුමක් ද?

(iii) "ඉනිබ්බේ පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ දෙයක් නො කරමි" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**උභය භ්‍රෂ්ට ව**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

i. අවස්ථා 3කි.

ii. පතිව්‍රතා ධර්මය රකිනු මිස මෙසේ නො කළ යුතු දේ නො කරන්න.

iii. මෙයින් මතු/ පසු ව / මතුවට පතිව්‍රතාව රැක ගැනීම මිස මෙවැනි වූ දෙයක් නො කරමි.

iv. දෙදෙනාගෙන් ම ගිලිහුණු / වෙන් වූ , දෙදෙනා ම අහිමි වූ / නැති වූ

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

(ඊ) එකෙණෙහි තමා පියාණන් පිටිපස්සෙහි උන්නාවූ ස්වර්ණතිලකා තොමෝ "උද්දාල බ්‍රාහ්මණයාණෝ නම් කවුරු දැ" යි විචාරා "තෙල **හඳුපීඨය** මත්තේ හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යැ" යි කී කල්හි තමාගේ නිලුපුල් පෙති දෙකක් හා සමාන නිර්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී, කොඳකැකුළු මෙන් සුදු සිනිඳු දත්පෙළෙහි මනහර සුදු රැසින් හින්නවර්ණ වූ අතිරක්ත අධරයුග්මය පොපි දෙවා මඳ මඳ සිනා පහළ කෙරෙමින් උද්දාල බ්‍රාහ්මණයා මුහුණ බලා තමා පෙරව ගෙන උන් පළස මඳක් පහකොට ශරීරප්‍රභා විහිදුවාලූව. හිරුරැස් කලබක් වැනි ඒ ශරීරාලෝකය දැක උද්දාල බ්‍රාහ්මණයා ඉතා ආශ්චර්යමත් ව කවර ආලොකයෙක් දෝ හොයි විස්මය පත් ව බලනුයේ ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතු ව මහත් වූ ශොකයෙන් දාහගත් ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු මුඛ නාසිකා හා කඳුලුධාරාවෙන් තෙත්වූ නෙත්‍ර ඇති ව විසංඥ විය.

(i) මේ පාඨයෙහි දෙනෙත් සහ දත් දෙපෙළ සමාන කොට ඇති වස්තු කවරේ ද?

(ii) ස්වර්ණතිලකාගේ ශරීරාලෝකය දැක්වීම සඳහා මෙහි යොදා ඇති උපමාව කුමක් ද?

(iii) "මහත් වූ ශොකයෙන් දාහගත් ශරීර ඇති ව" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**හඳුපීඨය**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. දෙනෙත් - නිලුපුල් පෙති දෙකකට / නිල් මානෙල් මල් පෙති දෙකකට

දත් පෙළ - කොඳ කැකුළු / කුන්ද මල් පොහොට්ටු / කුන්ද මල් කැකුළුවලට

ii. හිරුරැස් කලබක් වැනි / සූර්ය රශ්මි කලාපයක් බඳු

iii. අධික/ බලවත් ශෝකයෙන් පිලිස්සුණු / දැවී ගිය / දැවුණු සිරුර ඇති ව / දැඩි දුකින් තැවෙන සිරුරෙන් යුතු ව

iv. උතුම් පුටුව / බද්‍ර පුටුව / යහපත් ආසනය / උසස් අසුන/ විශේෂ පුද්ගලයන් උදෙසා පිළියෙල කළ අසුන

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

(උ)
මෙලෙසින් නොයෙක ව ර
දෙමවුපිය කී මෙහෙව ර
නොකළහොත් අනද ර
වෙතියි ඔහුගේ නුගුණ **නොසම** ර

හිමි තම නැණ නැ වින්
සැදි ගී තරඟ බෙහෙ වින්
වෙණ සිප් මහණ වින්
කෙළේ ඔහු පරතෙරට මැන වින්

(i) ගුත්තිල ඇදුරුතුමා මූසිලට වීණා ශිල්පය ඉගැන්වීමට තීරණය කළේ කවර හේතුවක් නිසා ද?

(ii) දෙ වන පද්‍යයෙහි අන්තර්ගත එක් රූපක අලංකාරයක් දක්වන්න.

(iii) "වෙණ සිප් මහණවින්" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**නොසමර**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. දෙමවුපියන් පැවරූ කාර්යය නො කර සිටියොත් අනාදරයක් වෙතැ යි සිතීම නිසා

ii. නැණ නැව් / ගී තුරඟ / වෙණ සිප් මහණව

iii. වීණා ශිල්පය නමැති මහ මුහුදෙන් / මහා සමුද්‍රයෙන් / මහා සාගරයෙන්/ මහ සයුරෙන්

iv. අමතක කොට / සිහිපත් නො කොට / කල්පනාවට නො ගෙන / සිහියට නො ගෙන/ ස්මරණය නො කොට

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

- (ඌ) සහ (එ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "මෙබඳු ස්ත්‍රීරත්නයෙකින් වියෝ ව ජීවත් වීමට වඩා මිය යාම යහපතැ."

(ii) "එම්බල බමුණ, අසන දෙයටත් වඩා දුටු දෙය ප්‍රත්‍යක්ෂ ය."

(iii) "මම තී පාදපරිචාරිකා කොට සොළොස් දහසක් පුරඟනාවන්ට අග මෙහෙසුන් කෙරෙමි."

(iv) "මෙතැන් පටන් නුඹවහන්සේ ද මාගේ පියාණන්වහන්සේ මය."

(v) "දැන් ඉතින් හඳේ පුර පැත්ත තමයි. මේ මහත්තයත් මට කතා කළා හේන් රැක බලා දෙන්ඩ අඳේකට."

(vi) "ඕව මොකවත් හිතට මතව ගන්ඩ එපා ... මං හෙට පංසල් තොයා ඉන්ඩ තීරණේ කෙරුවා."

(vii) "මැණික නම් මැණික වේ
කිලුටු පස් යට තිබී ලැබුණ මුත්"

(ලකුණු 03 × 4 = 12 යි.)

(i) ගම්පොළ අවධියේ දී දෙවන ධර්මකීර්ති සංඝරාජ හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. රාජ කුමාරවරුන් මිනිසුන් ලවා ස්වර්ණතිලකා මරණයට පත් කළ බව දැන ගත් අවස්ථාවෙහි උද්දාල බ්‍රාහ්මණයා විසින් තමාට ම ප්‍රකාශ කර ගන්නා ලද්දකි.

(ii) දඹදෙණි අවධියේ දී ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී වස්තුවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. අදින්නපුබ්බක බමුණා බුදුන් වහන්සේට දන් දී ප්‍රශ්න විචාරන අවස්ථාවේ දී බුදුන් වහන්සේ විසින් අදින්නපුබ්බක බමුණාට වදාරන ලද්දකි.

(iii) කුරුණෑගල අවධියේ දී ලියැවුණු පන්සිය පනස් ජාතක පොතේ චන්ද කින්නර ජාතක කථාවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. බ්‍රහ්මදත්ත රජතුමා කිඳුරාට ඊතලයකින් විදීමෙන් පසු ප්‍රහාර මුඛයෙන් (තුවාලයෙන්) ලේ වැගිරෙනු දුටු කිඳුරිය ශෝකයෙන් හඬන අවස්ථාවේ දී බරණැස් රජතුමා විසින් කිඳුරිය අස්වැසීමට පවසන ලද්දකි.

(iv) දඹදෙණි අවධියේ දී මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ ජීවක කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. රජගහ නුවර සිටාණන්ගේ ශීර්ෂාබාධය සුවපත් කළ පසු එතුමා තමාගේ සියලු සැප සම්පත් සහ තම ජීවිතය ද පාවා ගන්නැ යි පැවසූ අවස්ථාවේ ජීවක වෛද්‍යවරයා විසින් සිටුතුමාට පවසන ලද්දකි.

(v) ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත විලේජ් ඉන් ද ජංගල් නවකථාවේ සිංහල අනුවාදය වන ඒ.පී. ගුණරත්නයන්ගේ බැද්දේගම කෘතියෙන් උපුටා ගන්නා ලද පාඨයකි. පුංචි මැණිකා ලබා ගැනීමට ප්‍රනාන්දු මුදලාලි බබෙහාමි ආරච්චිල සමග සැලසුම් කරන විට එතැනට ගෙන්වා ගත් බබුන්ගෙන් තොරතුරු විමසන අවස්ථාවේ දී බබුන් විසින් බබෙහාමි ආරච්චිලට හා ප්‍රනාන්දු මුදලාලිට පවසන ලද්දකි.

(vi) සයිමන් නවගත්තේගම විසින් රචිත ස්නේහය කෙටිකතාවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. රන්කිරා උන්දැ වැර්ලස් එකෙන් සිය පුත්‍රයාගේ කටහඬ ඇසීමට කඩයට ගොස් පැමිණි දින රාත්‍රියේ සිය සැමියා අසල සිට බුලත් විටක් කොටමින් සිටින අවස්ථාවේ දී පිංචි මහයියා විසින් රන්කිරා උන්දැට (සිය සැමියාට) පවසන ලද්දකි.

(vii) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කරන ලද පෙමතො ජායතී සොකො නාට්‍යයෙන් උපුටා ගන්නා ලද පාඨයකි. ගායක කණ්ඩායම විසින් උද්දාල බ්‍රාහ්මණයාට ස්වර්ණතිලකා නොගැළපෙන බවට හේතු ඉදිරිපත් කළ අවස්ථාවේ දී තමාට ස්වර්ණතිලකා ගැළපෙන බව පවසමින් උද්දාල බ්‍රාහ්මණයා විසින් පවසන ලද්දකි.

**ලකුණු දීමේ නිර්ණායක**
කතුවරයා, කෘතිය, කථා වස්තුව/කතාව සඳහා ලකුණු 01යි.
කා විසින් කාට කියන ලද ද ලකුණු 01යි.
අවස්ථාවට ලකුණු 01 යි.

(ඩ) පහත සඳහන් පද්‍ය පන්තියේ භාෂා භාවිතය හා කාව්‍ය ආකෘතිය පිළිබඳ අවධානය යොමු කරමින් රසාස්වාදයක් කරන්න.

**අඳුර අපේ දුක නිවාවි**

යමන් කළුවෙ ගෙදර යන්න, කන්ද උඩින් අඳුර එනව
උඹට වගේ මගෙ ඇඟටත් හරි ම මහන්සිය දැනෙනව

අඳුර තමයි අපෙ ඇඟපත නිවන්න දෙවියෝ එව්වේ
හනික යමන් ගාල් වෙන්න පිදුරු ගොඩේ ගෙයි මූල්ලේ

උදේ හිටන් අව් කට්ටෙ උඹව තියන් මැඩවෙව්වට
උඹේ හිතට අමාරු දැයි කියාපන්කො දැන්වත් මට
කරුමෙ තමයි පළිසන් දෙන්නේ අපගේ මේ විදියට
බුදුහාමුදුරුවො කිව්වේ ඒක තමයි දුක නිවන්ට

ගෙදර ගිහින් ඇළ ගාවින් හොඳ තණකොළ ටිකක් උඹට
තලු ගහ ගහ බඩ පිරෙන්න ගෙනැත් දාන්නම් කන්නට
දෙයියො තමයි අඳුර දුන්නෙ අපෙ ඇඟපත ගිනි නිවන්ට
හනික යමන් ගාල් වෙලා අඳුරු රෙද්ද පෙරව ගන්ට

මගේ කකුලෙ කටු ඇනිලා, ඉවසන්නට බැහැ රිදේවි
අන්දකාරෙ තෙල් ගාලා ඒ විස කටු ඇද දමාවි

හැන්දෑවට උඹ ඉඳගෙන තලු ගහනව මට ඇහෙනව
උඹට කළුවෙ, හුඟක් හොර ද හැන්දෑවට නින්ද යනව
අඳුර ඇවිත් මගෙ නළලට නම් මන්තරයක් කියනව
ඒ එක්ක ම ඇහැ පියවිල එළි වෙන තුරු නින්ද යනව

දෙයියො තමයි අඳුර දුන්නෙ අපෙ ඇඟපත නිවා ලන්ට
යමන් කළුවෙ ගාල් වෙලා, එකට වැටී නිදා ගන්ට

තුනට්ය මගෙ කක්කියනව බොහොම නොසැහෙන විදියට
අඳුර හන්දි තෙල් ගාලා අත ගාවිය එය හෙමිහිට

අඳුර රෙද්ද පෙරවාලා අපෙ ඇඟපත නිදි කරාවි
අඳුර අපේ දුක නිවලා දාහක් ගින්දර නිවාවි

(ලකුණු 12 යි.)

පද්‍යයේ කථකයා සහ ගවයකු අතර පවත්නා සබඳතාවක් මෙම පද්‍ය පන්තියෙන් නිරූපණය වෙයි. දිවා කාලයේ දී ගවයා කිසියම් වෙහෙසකර කාර්යයක යෙදවීමෙන් අනතුරු ව සන්ධ්‍යා කාලයේ දී ගමනේ යෙදෙන අතර සිය ගවයාට ආමන්ත්‍රණය කරන ආකාරය මෙමගින් ප්‍රකාශිත ය. ඔවුන් දෙදෙනා අතර පවත්නා ළෙන්ගතුකමේ ස්වරූපය මෙම පද්‍ය නිර්මාණයෙන් නිරූපිත ය.

භාෂා භාවිතය

- සංකේතාත්මක බස් වහර

  උදා:

  අඳුර - අවිද්‍යාව, මෝහය සංකේතවත් වේ .

  විසකටු - දුක්ඛ දෝමනස්සයන්, කායික මානසික වේදනාවන්

- ගැමි වහර භාවිතය

  තේමාවට උචිත ආකාරයෙන් ගැමි බස් වහරක් භාවිත කර තිබේ.

  උදා :

අව් කට්ටෙ, පළිසන් දෙන්නේ, කරුමෙ තමයි, කක්කියනව, තලු ගහ ගහ, හන්දි තෙල් ගාලා, මන්තරයක්, ඇහැ පියවිල, මැඩවෙච්චට, හුහක් හොර ද, දාහක් ගින්දර

- **සංවාදශීලී බස් වහරක් භාවිතය**

කථකයා ගවයා ආමන්ත්‍රණය සඳහා ආදරණීය යෙදුම් භාවිත කරයි.

"යමං කළුවෙ ගෙදර යන්න..."

"උඹේ හිතට අමාරු දැයි කියාපන්කො දැන්වත් මට"

"හනික යමන්..."

"උඹට කළුවෙ හුහක් හොර ද හැන්දෑවට නින්ද යනව"

"යමන් කළුවෙ ගාල් වෙලා එකට වැටී නිදා ගන්න"

- **රූපකාර්ථවත් බස් වහර**

"හනික යමන් ගාල් වෙලා අඳුර රෙද්ද පෙරවගන්ට"

"අන්දකාරෙ තෙල් ගාලා ඒ විසකටු ඇද දමාවි"

" අඳුර හන්දි තෙල් ගාලා ..."

- **සංකල්ප රූප භාවිතය**

  " කන්ද උඩින් අඳුර එනව"

  "අන්දකාරෙ තෙල් ගාලා ඒ විසකටු ඇද දමාවි"

  " අඳුර හන්දි තෙල් ගාලා අතගාවිය එය හනිකට"

  "හැන්දෑවට උඹ ඉඳගෙන තලු ගහනව මට ඇහෙනව"

- පුනරුක්ති භාවිතය

  කාව්‍ය දෝෂයක් වන පුනරුක්තිය, කවියා කාව්‍යයට ආභරණයක් සේ යොදා ගෙන ඇත.

  'අඳුර' යන වචනය පුනර්වාචක ව යෙදේ.

  "දෙයියො තමයි අඳුර දුන්නෙ අපෙ ඇඟ පත නිවා ගන්න"

  "දෙයියො තමයි අඳුර දුන්නෙ අපෙ ඇඟ පත ගිනි නිවන්න"

- ආකෘතිය
  - දෙපද හා සිවුපද ආකෘති සම්මිශ්‍රිත වීම
  - ජනකවි ආරකින් යුක්ත වීම.
  - එසේ ම බොහෝ පද්‍ය පාදාන්ත එළි වැට සහිත වීම.

- සාහිත්‍යමය අගය විමසීමේ දී මෙවන් කරුණු පිළිතුරට ඇතුළත් වීම ඉහළ ලකුණක් ප්‍රදානය කිරීමට ඉවහල් වේ.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)**

**(ලකුණු 12 යි)**

2. (අ) "ජීවිත පරිඥානයක් ඇති ලේඛකයා මානව චර්යාධර්ම ආශ්‍රය කොට ගෙන මනා ලෙස චරිත නිරූපණයෙහි යෙදෙයි" සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමසන්න.

**නැත හොත්**

(ආ) ජාතක කථාවල සංදර්භීය ලක්ෂණ කෙටියෙන් දක්වා, ජාතක කථා මගින් මිනිස් සිතෙහි සැඟවුණු තැන් විවර කොට පෙන්වන ආකාරය නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

(අ) ජීවිතය පිළිබඳ මනා අවබෝධයක් සහ දැක්මක් ඇති ලේඛකයකු ලෙස ධර්මසේන හිමියන් මානව චර්යා ඇසුරින් මනා ලෙස චරිත නිරූපණය කර ඇති ආකාරය සද්ධර්මරත්නාවලියේ එන මට්ටකුණ්ඩලී වස්තුව හා කුණ්ඩලකේසී වස්තුව යන කථා දෙකෙන් මනා ව නිරූපණය කොට තිබේ.

- **අදින්නපුබ්බක -** සිය මසුරුකම ලෝකයා දැන ගනිති 'යි සිතූ ඔහු , මිය යාමට ආසන්න දරුවා ගෙයින් ඉවතට ගෙන, පිලට දැමීම.
- ඔහු සිය පුත්‍රයා මළ පසු ආදාහනය කළ සොහොනට ගොස් හඬා වැලපීම. මෙය ඛේදවාචකයන් හමුවේ මිනිසුන්ගේ සැබෑ චර්යාවන් ඉස්මතු වන අවස්ථාවකි.

**මට්ටකුණ්ඩලී -**

- මට්ටකුණ්ඩලී දෙව් පුත් තමා දිව්‍ය ලෝකයේ ඉපදීම සඳහා කළ පින සලකා බලන විට තම පෙර භවයේ පියාණන් නිවැරදි මාර්ගයට යොමු කරවීම සඳහා උපක්‍රම යෙදීම.
- මටකොඩොල් දෙව් පුත් වෙසින් සොහොනට පැමිණ පෙර භවයේ පියා සමග කථා කළ පසු අනුකම්පාවක් ඇති වී අවවාද අනුශාසනා කිරීම.

**කුණ්ඩලකේසී -**

- හුදෙකලා ජීවිතයක් ගත කළ කුණ්ඩලකේසීට සිය ජීවිතය භාර කිරීමට සොරකු වුව ද කම් නැතැ යි යන සිතිවිල්ලක් ඇති විය හැකි වීම.
- සොරපවුවේ දී ඇයට නුවණ පහළ වී මරණයෙන් ගැලවීම

**සොරා -**

- ව්‍යාජ ආදරයක් පෙන්වා, කුණ්ඩලකේසී රවටා ඇය මරා දමා හෝ ඇයගේ ආභරණ ලබා ගැනීමට උපක්‍රම යෙදීම.

**නැතහොත්**

ජාතක කතාවේ සංදර්භීය ලක්ෂණ

වර්තමාන කථාව, අතීත කථාව, ගාථාව,ධර්ම විස්තරය, සමෝධානය යන කරුණු පහෙන් වර්තමාන කථාව, අතීත කථාව හා සමෝධානය යන කරුණු පිළිබඳ ව අවධානය යොමු කිරීම ප්‍රමාණවත් ය. එහි දී ජාතක කතා මගින් මිනිස් සිතෙහි සැඟවුණු තැන් විවර කොට දැක්වූ ආකාරය නිර්දිෂ්ට කතා ඇසුරින් උදාහරණ සහිත ව පැහැදිලි කිරීම පිළිතුරෙන් අපේක්ෂිත යි.

මුල් කොටසේ විස්තර කළ යුතුයි

කථාව විස්තර කර තිබෙනවා X

<u>චුල්ල ධනුද්ධර ජාතකය</u>

- ධනු ශිල්පයෙහි පරතෙරට පැමිණි ධනුද්ධර බිරිය ලවා සොරුන්ගෙන් මස් ඉල්ලීම.
- ලද අවස්ථාවේ ස්වාමියාට නො ව සොරාට කඩු මිට දෙන්නට කුමරිය පෙළඹීම.
- සොර දෙටුවා "බාල කල පටන් පරණ පුරුදු පුරුෂයා මරවා මා කෙරේ ලෝභ කළා ය" යන සිතුවිල්ලෙන් ස්ත්‍රිය තමාට ද එලෙස කරන බව සිතා අතහැර යාම.
  "තිගෙන් මට ප්‍රයෝජන නැතැයි..." සිතීම.

<u>චන්ද කින්නර ජාතකය</u>

- ස්වාමී භක්තිය/ පතිභක්තිය ආත්ම ගණන් රැකගත් කාන්තා චරිතයක් ලෙස කිඳුරියගේ චරිතය
- තම ස්වාමියාගේ ජීවිතය වෙනුවෙන් රජුට ශාප කිරීම.
- පිරිමි සිත් තුළ කාන්තාවක දුටු පමණින් ඇතිවන පිළිබඳ සිතක් නිසා කිඳුරාගේ ජීවිතය විනාශයට පත් කිරීමට රජු උත්සාහ කිරීම.
- කාමයෙහි ආසක්ත වූ විට යථාවබෝධය නො ලැබීම.
  කිඳුරාගේ චරිතයෙන් තමාගේ සුඛ දුක්ඛයට නො ව තම ප්‍රියම්බිකාවගේ ශෝකය පිළිබඳ ව කනගාටු වන ස්වාමිපුරුෂයකුගේ සිතුවිලි විවරණය කිරීම.

මේ ආදී තොරතුරු ඇසුරෙන් නිදසුන් පාඨ සහිත ව පිළිතුරු ලියා තිබීම අපේක්ෂිත යි.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න )** (ලකුණු 15 යි)

**3.** පහත **(අ)** කොටසේ ප්‍රශ්නය සහ **(ආ)** කොටසින් එක් ප්‍රශ්නයක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

**(අ)** කුරුණෑගල සහ ගම්පළ සාහිත්‍ය අවධිවල රචනා වූ ගද්‍ය නිර්මාණ අතුරෙන් **තුනක්** පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 07 යි.)

**(ආ)** කිසියම් වෘත්තාන්තයක ප්‍රධාන සිද්ධි හඳුනාගෙන ඒවා පුළුල් ලෙස විස්තර කරමින් ශ්‍රාවකයාට ප්‍රයෝජනවත් කථාවක් ඉදිරිපත් කොට ඇති ආකාරය සද්ධර්මාලංකාරයේ නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න.

**නැත හොත්**

"පූජාවලිය ජනප්‍රිය ගද්‍ය කාව්‍යයක් වන්නේ ජනකාන්ත කථාන්තර කලාවක් අනුගමනය කිරීම නිසා ය" මේ අදහස නිර්දිෂ්ට කථාවලින් ගත් නිදසුන් සහිත ව විමර්ශනයට ලක් කරන්න. (ලකුණු 08 යි.)

(අ) කුරුණෑගල සහ ගම්පොළ යන අවධි දෙක ම නියෝජනය වන ආකාරයට තෝරාගත් කෘති තුනක් පිළිබඳ කෙටි විස්තරයක් සැපයීම පිළිතුරේ දී අපේක්ෂිත ය. <u>මෙහි දී ග්‍රන්ථ නාමය , කර්තෘත්වය සහ අන්තර්ගතය ආදිය පිළිබඳ කරුණු දක්වා තිබීම ප්‍රමාණවත් ය.</u>

අදාළ කර්තෘත්ව / නිපුණතා

- කුරුණෑගල අවධිය

පන්සිය පනස් ජාතක පොත, ථූපවංසය, උම්මග්ග ජාතකය, සිංහල බෝධි වංසය, දළදා සිරිත, අනාගත වංසය, දළදා පූජාවලිය

- ගම්පොළ අවධිය

එළු අත්තනගලු වංසය, නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතරණය, සද්ධර්මාලංකාරය

( ලකුණු 07 යි.)

(ආ) සද්ධර්මාලංකාරයේ එන ස්වර්ණතිලකා කතා වස්තුව සහ නන්දිවාණිජ කතා වස්තුව යන කථා දෙකෙහි ම ප්‍රධාන සිද්ධි හඳුනාගෙන ඒවා පුළුල් ලෙස විස්තර කරමින් ශ්‍රාවකයන්ට ප්‍රයෝජනවත් කතාවක් ඉදිරිපත් කර ඇති ආකාරය විස්තර විය යුතු යි.

කථා වස්තුවල ප්‍රධාන සිදුවීම් කිහිපයක් පහත දැක්වේ;

<u>ස්වර්ණතිලකා වස්තුව</u>

- ස්වර්ණතිලකා පූර්ව භවයේ දී මල් පූජා කොට ප්‍රාර්ථනාව සිදු කළ අවස්ථාව.
- ස්වර්ණතිලකා සහ පියාට අතරමග දී හමුවන රජවරුන් පස්දෙනා ස්වර්ණතිලකාට වසඟ වී ඇය ලබා ගත නො හැකි බව දැන තම අතින් ම දිවි තොර කර ගැනීම.
- උද්දාල බ්‍රාහ්මණයා වසඟ කර ගැනීමේ අවස්ථාව.
- මිතුරන් විරුද්ධ වුවත් උද්දාල බමුණා ඒ නො සලකා හැරීම.
- විවාහයෙන් පසු සාර මසක් නිවසේ ම ගත කළ උද්දාල බ්‍රාහ්මණයාගේ ක්‍රියාව හේතුවෙන් ඔහුගේ ශිෂ්‍යයන් ස්වර්ණතිලකා කෙරෙහි වෛරී චේතනාවක් ඇති කර ගැනීම.

<u>නන්දිවාණිජ වස්තුව</u>

- ශිව අමාත්‍යයා බදු එකතු කිරීමේ රාජකාරි භාර ගැනීමේ අවස්ථාව.
- නන්දිවාණිජගේ බිරිය කෙරෙහි කාමයෙන් වසඟ වීම නිසා ඇය පොළඹවා ගැනීමට මෙහෙකාර කෙල්ලක ලවා පඬුරු යවා ඇවිටිලි කරවීම.
- ශිව අමාත්‍යයා කාමයට වසඟ වීම නිසා තම දිවිය පවා අහිමි කර ගැනීම.
- නන්දිවාණිජ සහ බිරියගේ යහපත් හැසිරීම් නිසා මෙලොව ධර්මානුකූල ව සැප සේ ගත කර පරිවාර ජනයා සමග සියල්ලන් ම දිව්‍ය ලෝකයේ ඉපදීම

මෙසේ සෑම කතා වස්තුවක දී ම ප්‍රධාන සිදු වීම් කවරේ දැයි හඳුනාගෙන, ඒවා පැහැදිලි කරමින් ශ්‍රාවකයාගේ ජීවිතයට ආදර්ශයක් ලබාගත හැකි වන පරිද්දෙන් කතා වස්තු උදාහරණ සහිත ව දක්වා ඉදිරිපත් කොට තිබිය යුතු ය.

( ලකුණු 08 යි.)

නැතහොත්

අනුරුද්ධ කථා වස්තුව

**පූජාවලිය ජනතාවගේ ප්‍රසාදයට ලක් වූ ගද්‍ය කාව්‍යයක් වේ. එයට ප්‍රධාන හේතුව නම් ජනතාවගේ සිත් කථා වස්තුවට ඇද බැඳ තබා ගන්නා ආකාරයට එහි කථා වස්තු සකස් කොට තිබීමය. කථාව ආරම්භයේ සිට අවසානය තෙක් කුතුහලය මතුවන පරිද්දෙන් එකින් එක සිදු වීම් සකස් කොට ඇති බැවින් ජනතාවගේ සිත් දිනාගැනීමට ඒ කථා වස්තු වලට හැකි වී තිබේ. එබඳු ස්ථාන කිහිපයක් පහත දැක්වේ.**

- අනුරුද්ධ කුමාර කථාවේ දී අනුරුද්ධ කුමාරයා සහල් උපදින ස්ථානය වත් නො දන්නා කෙනකු බව දැක්වීම.
- රාජකීයයන්ගේ ජීවිතවල ස්වරූපය දැක්වීමට 'නැත' යන වචනයේ අර්ථයවත් නොදන්නා ළමා චරිතයක් සම්බන්ධ කර ගැනීම.
- මහානාම කුමාරයා විසින් අනුරුද්ධ කුමාරයා පැවිදි වීමට පෙළඹවීම සඳහා සියුම් උපායක් වශයෙන් කෘෂිකර්මාන්තයේ දුෂ්කරතා පැහැදිලි කර දෙනු ලැබීම.
- කතා වස්තුවේ දී අද්භූතජනක ස්වරූපයකින් ජීවකගේ උත්පත්තිය පිළිබඳ තොරතුරු දැක්වීම.

**ජීවක කථා වස්තුව**

- වෛද්‍ය වෘත්තිය සඳහා අදාළ සුදුසුකම් ඉතා ඉක්මනින් ලබා ගත් ආකාරය.
- දුෂ්කර කාර්යභාරයක් ඉටු කරමින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම අසාධ්‍ය රෝගී තත්ත්වයන්ගෙන් ඔවුන් අත්මුදවා ගැනීම.

ආදි සිදුවීම් ශ්‍රාවකයන්ගේ සිත් කාවදින පරිද්දෙන් ඉදිරිපත් කොට තිබෙන ආකාරය පැහැදිලි කොට තිබිය යුතු යි.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)** **( ලකුණු 08 යි.)**

**4. "ගුත්තිල කාව්‍යයේ කථා ශරීරයත් වර්ණනාත් අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී" යටත් පිරිසෙයින් වර්ණනා තුනක් වත් ඇසුරෙන් සාකච්ඡා කරන්න.** (ලකුණු 15 යි.)

ගුත්තිල කාව්‍යයේ කථා ශරීරයත්, වර්ණනාත් අතර අවියෝජනීය සබඳකමක් පවතී. මෙහි කථා ශරීරය කථාන්තරයක් සේ ගලාගෙන යන අතර කථාව සහ වර්ණනා වෙන් කළ නො හැකි සේ ඒකාබද්ධ වී ඇත. නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

**උදේනිපුර සැණකෙළිය**

කලා කුසලතාවලින් ජනතාව අතර, කැපී පෙනුණු පුද්ගලයෙකු ඉස්මතු කොට දැක්වීමට සැණකෙළි වැනුම යොදා ගෙන තිබේ.

**වීණා වාදනය**

ගුත්තිල මූසිල අතර තරගය ඇති වූ අවස්ථාවේ දී ගුත්තිල පඬිවරයාට උපක්‍රමශීලීව ජයග්‍රහණය අත්පත් කර දීමට වීණා වාදන වර්ණනාව යොදා ගෙන තිබේ.

**සුරඟන වැනුම**

ගුත්තිල පඬිවරයාට ජයග්‍රහණය අත් වූ බව සනාථ කරමින් මූසිල අන්දමන්ද කරවීම සඳහා සුරඟන වැනුම යොදා ගෙන ඇත.

මෙසේ තෝරා ගෙන ඇති සැම වර්ණනයක් ම කථා ශරීරයේ කිසියම් අවස්ථාවකට අදාළ වන පරිද්දෙන් යොදා ගෙන ඇති බව ප්‍රකාශ විය යුතු අතර, ඒ වැනුම් ඉවත් කළ හොත් කථා රසය බිඳ වැටෙන බව තහවුරු කොට තිබිය යුතු ය.

**(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)** **( ලකුණු 15 යි.)**

**5. "බැද්දේගම ජන ජීවිතය ඛේදවාචකයක් බවට පත් වූයේ බලවතුන් විසින් දුබලයන් පෙළීමට ගන්නා ලද උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි" යෝග්‍ය නිදසුන් මගින් මේ අදහස විමර්ශනය කරන්න.** (ලකුණු 15 යි.)

බලවතුන් විසින් දුබලයන් පෙළීමට ගන්නා ලද උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් බැද්දේගම ජන ජීවිතය ඛේදවාචකයක් වූ ආකාරය විමර්ශනය කිරීම මෙම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

මෙහි දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

- බැද්දේගම විසූ බලවතුන් වූ ආරච්චිල, ප්‍රනාන්දු ආදීන්ගේ බලාධිකාරිය නිසා සිලිඳු ඇතුළු ගැමි ජනයා නිරන්තරයෙන් පීඩාවට පත් වූ ආකාරය.
- ගැමියන්ට හේන් බලපත්‍ර ලබා දීමේ කටයුතුවල දී මෙන් ම මුදල් හා ධාන්‍ය ණයට ලබා දීමේ කටයුතුවල දී ද බලවතුන් විසින් ගැමි ජනයා නිරන්තරයෙන් අසාධාරණ ලෙස සූරා කෑමට ලක් කිරීම.

- බලවතුන්ගේ අනිසි මැදිහත්වීම නිසා ගැමි ජනයා දුබලයින් ලෙස නිරතුරු ව හඳුන්වා දීම.
- ගුප්ත විද්‍යා හැකියා පවා ගැමි ජනයා පෙළීමට යොදා ගැනීම.
- නිල බලය හා ධන බලය යොදා ගැනීමෙන් නීතිමය කටයුතුවල දී ද ජනතාවට සාධාරණයක් ඇත්වීමේ ඉඩකඩ අහිමි කිරීම හා ස්වකීය නිර්දෝෂී භාවය ප්‍රකාශ කිරීමට පවා අවස්ථාවක් නො ලැබීම.

මේ ආදි කරුණු හේතු කොට ගෙන බලවතුන්ගේ පීඩා නිසා බැද්දේගම ජන ජීවිතය ඛේදවාචකයක් වූ ආකාරය උචිත නිදසුන් ඇසුරින් පැහැදිලි කොට තිබිය යුතු යි.

**6.** සමකාලීන සමාජ ගැටලු නිරූපණයෙහි ලා කෙටිකතා රචකයා දක්වන සාමර්ථ්‍යය නිර්දිෂ්ට කෙටිකතා **තුනක් වත්** ආශ්‍රයෙන් විග්‍රහ කරන්න. (ලකුණු 15 යි.)

සමකාලීන සමාජ ගැටලු නිරූපණයෙහි ලා කෙටිකතා රචකයා දක්වන සාමර්ථ්‍යය නිර්දිෂ්ට කෙටිකතා **තුනක් වත්** ආශ්‍රයෙන් විග්‍රහ කොට තිබීම අපේක්ෂිත ය.

මේ සඳහා නිර්දිෂ්ට කෙටිකතා අතුරෙන් කරත්තය, අතුරට යන වේලාවේ, කළු සපත්තු, කවියෙකුට අත්දැකීමක්, කපිතන්ගේ පුත්තු , මිනිස් වටය, හැත්තෑ ලක්ෂයෙන් එකෙක් , ගස්, නිදහස් උදෑසන ආදි කෙටි කතා නිදසුන් ලෙස දැක්විය හැකි ය. මෙවායින් කෙටි කතා තුනක් වත් තෝරා ගෙන උදාහරණ සහිත ව පිළිතුරු ලියා තිබි ය යුතු ය.

- ඉහත කෙටිකතාවලට අමතර ව නිර්දිෂ්ට වෙනත් කෙටිකතා උදාහරණ සහිත ව යොදා ගෙන සමාජ ගැටලු නිරූපණය කර ඇති ආකාරය දක්වා ඇති නම් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

උදාහරණ සඳහා කෙටි කතා තෝරා ගැනීමේ දී කෙටිකතා එකක් හෝ දෙකක් හෝ පමණක් යොදා ගෙන ඇති නම් ඊට සමානුපාතික ව ලකුණු පිරිනැමිය යුතු යි. ( ලකුණු 15 යි.)

කෙටිකතා දෙකක් නම් ලකුණු 10 යි , එකක් නම් ලකුණු 5 යි

**7.** **නිර්මාණාත්මක හැකියාව හා භාෂා භාවිතය අතින් නිදහස් කවීන් දැක්වූ සාමර්ථ්‍යය අභිමත කවීන් තිදෙනෙකුගේ නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.** **(ලකුණු 15 යි.)**

නිර්මාණාත්මක හැකියාව හා භාෂා භාවිතය අතින් නිදහස් කවියාගේ සාමර්ථ්‍යය මැනවින් නිරූපණය වන අවස්ථා අදාළ කාව්‍ය නිර්මාණ ඇසුරින් නිදසුන් සහිත ව තහවුරු වී තිබිය යුතු ය. මේ සඳහා අබිනික්මන (සිරි ගුනසිංහ), මාර යුද්ධය (මහගම සේකර), රන් තැටියක කඳුළු (දයාසේන ගුණසිංහ), නාගල කන්ද (විමල් දිසානායක), තුරු සෙනග හා තණ පඳුර (ආරියවංශ රණවීර), දේදුන්න පායාවි හෙටත් පාලම උඩින් (පරාක්‍රම කොඩිතුවක්කු), සතුට (ලාල් හෑගොඩ), දුරු රට ගිය පුතු (බුද්ධදාස ගලප්පත්ති), නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව (ධර්මසිරි රාජපක්ෂ), පරමල් (රත්න ශ්‍රී විජේසිංහ ), ආදරණීය පාසල (නන්දන වීරසිංහ) යන නිදහස් පද්‍ය නිර්මාණ අතුරෙන් සුදුසු නිර්මාණ තුනක් නිදසුන් සේ සපයමින් පිළිතුරු ලියා තිබීම අපේක්ෂිත යි.

<u>නිර්මාණාත්මක හැකියාව</u>

නිදහස් කවීන් විසින් තෝරා ගනු ලැබූ කාව්‍යානුභූති නිදහස් කාව්‍ය ආකෘතිය තුළ වඩාත් නිදහස් ලෙස හා නිර්මාණාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීම කෙරෙහි මනා පරිචයක් ප්‍රකට කර ඇති බැව් පැහැදිලි විය යුතු ය. මෙහි දී වස්තු විෂය , භාෂා භාවිතය සහ කාව්‍ය ආකෘතිය යන අංශ තුනෙන් කවියාගේ නිර්මාණාත්මක ස්වරූපය ප්‍රකට කර තිබේ දැයි අවධානයට ගත යුතු යි.

උදාහරණ:

- සිරි ගුනසිංහයන්ගේ 'අබිනික්මන' පද්‍ය නිර්මාණයේ දී බෞද්ධ සාහිත්‍යයේ එන සිදුහත් කුමරු ගිහි ගෙය හැර යෑමේ අවස්ථාව හෙවත් අබිනික්මන යන සංකල්පය නූතන තරුණයකුගේ ජීවිතය හා ගළපමින් නව අර්ථකථනයකින් යුතු ව ඉදිරිපත් කිරීමට ප්‍රයත්නයක් දරා තිබීම.

- මහගම සේකර විසින් රචිත 'මාර යුද්ධය' පද්‍ය නිර්මාණයේ දී බොදු සිරිතේ එන සිදුහත් තවුසා දසබිම්බරක් මාර සේනාව පරාජය කර, බුද්ධත්වය ලැබීමේ අවස්ථාව දෙස වෙනත් දෘෂ්ටියකින් බලමින් නිර්මාණාත්මක ලෙස කාව්‍යයට නඟා තිබීම.
(මෙහි දී කවියා මාර යුද්ධය ලෙස ඉදිරිපත් කරනුයේ සිදුහත් කුමරු සහ යශෝධරාව අතර පැවති ප්‍රේමණීය බන්ධනයෙන් අත්මිදීම සඳහා සිදු කරන ලද මානසික අරගලය යි.)

- දයාසේන ගුණසිංහයන්ගේ 'රන්තැටියක කඳුළ' පද්‍ය නිර්මාණයේ දී උපතේ දී ම මිය ගිය බිලිඳියකගේ වියෝගය පියකුගේ දෘෂ්ටියෙන් ඉදිරිපත් කර තිබෙන ආකාරය නිර්මාණාත්මක ය. එම දැරිය වළ දමන අවස්ථාවේ පියා අත්විඳි මනෝභාවයන් නිර්මාණාත්මක ලෙස සංකල්ප රූප මැවෙන ආකාරයෙන් ඉදිරිපත් කිරීමට සමත් වී තිබීම.

- විමල් දිසානායකගේ 'නාගලකන්ද' පද්‍ය නිර්මාණයේ දී නාගලකන්ද යන භෞතික වස්තුව සංකේතාත්මක ලෙසත් නිර්මාණාත්මක ලෙසත් යොදා ගෙන තිබීම.

- ආරියවංශ රණවීරගේ 'තුරුසෙනග හා තණ පඳුර', රත්න ශ්‍රී විජේසිංහයන්ගේ 'පරමල්' යන පද්‍ය නිර්මාණවල දී ද භෞතික සංකේත ඇසුරු කර ගනිමින් නිර්මාණාත්මක පද්‍ය රචනය කෙරෙහි නිදහස් කවීන් සතු හැකියාව ප්‍රකට කොට තිබේ.

<u>භාෂා භාවිතය</u>

- සංකල්ප රූප මැවෙන සජීව බස් වහර

උදා : ''සුවහසක් තරු පිරුණු රාත්‍රියේ ද''

''නිල් අහස් වියන යට''

''මොහොතකින් සඳ ඒවි තනියට''

''සූරලා ගෙන යන්න මා හදේ පිපුණු මල්''

<u>උපමා , රූපක ආදී අර්ථාලංකාර භාවිතය</u>

- උපමා

''දැවටෙන්නේ සේද සළුවක් සේ'' , '' අමතක වූ වචනයක් මෙන්''

- රූපක

'සෙනෙහසේ නිධානය' , 'කාලයේ ගැබ'

<u>වෙනත් කාව්‍යෝපක්‍රම භාවිතය</u>

- උත්ප්‍රාසය

'ආදරණීය පාසල' . 'මගේ ශුද්ධ වූ පාසල'

<u>අනුප්‍රාසය, එළිවැට භාවිතය</u>

''සෙමෙන් තව තව සෙමෙන්'' , ''නිදන අන්තඃපුරය හැර දා'' , ''කිරිය හැර දා පුතු ද හැර දා''

**මෙවැනි උචිත උදාහරණ සහිත ව පිළිතුරු ලබා දී තිබේ නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න. (ලකුණු 15 යි.)**

**8. "උද්දාල බ්‍රාහ්මණයා ස්වකීය විනාශය තමා විසින් ම කැඳවා ගන්නා ලද්දේ තම සිතැඟි පාශයෙහි ගොදුරක් වීම හේතු කොට ගෙන ය" නිදසුන් තුනක් වත් ඇසුරෙන් විග්‍රහ කරන්න.** (ලකුණු 15 යි.)

උද්දාල බ්‍රාහ්මණයාගේ ජීවිත විනාශයට හේතුව අනෙකෙකු නොව තමාම බව පිළිතුරෙන් පැහැදිලි කොට තිබිය යුතු ය. නාට්‍යයේ ආරම්භක අංකයේ දී සූත්‍රධාර විසින් ගායනා කරනු ලැබෙන ගීතයෙන් උද්දාලගේ මනසේ පැවති ස්වභාවය ප්‍රේක්ෂකයා හමුවට ගෙන එයි.

''කෙලෙස් මලයෙන් මලින සතහට - ගොදුරු වී තම සිතැඟි පාසෙහි"

- ස්වර්ණතිලකා මුල් වරට දුටු අවස්ථාවේ ඔහු චිත්ත වික්ෂිප්ත භාවයට පත් වීම
- ඔහුගේ සිතෙහි හට ගන්නා හැඟීම්වලින් මිදෙනු නො හැකි ව ළතැවීම
- ස්වකීය වග කීම් පැහැර හරිමින් ක්‍රියා කිරීම
- පියාට තනතුරු ලබා දී ස්වර්ණතිලකා රඳවා ගැනීමට තැත් කිරීම
- ස්වර්ණතිලකා උද්දාලට නො ගැළපෙන බව ප්‍රකට වුවත් , ඇය තමාට ගැළපෙන බවට හේතු කාරණා ඉදිරිපත් කිරීම
- සමාජ සම්මතයන්ට එරෙහි ව ස්වර්ණතිලකා විවාහ කර ගැනීම
- අතීත දිවියේ නිරර්ථක භාවය නිතර සිහි කිරීම
- ස්වර්ණතිලකා මරණයට පත් කරන ලද බව අසා තමා ද දිවි තොර කර ගැනීම

මෙවැනි කරුණු ඇසුරෙන් උද්දාලගේ ජීවිත විනාශයට මඟ තමා විසින් ම සකසා ගෙන ඇති බව තහවුරු කොට තිබිය යුතු ය.

(ලකුණු 15 යි.)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

සිංහල II
சிங்களம் II
Sinhala II

**71 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**විභාග අංකය :** ..........................

උපදෙස්:

- I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට **මේ ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 අල්පප්‍රාණ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ම න බ ය ජ ර ස
(2) ක ච ට ත ප බ ද
(3) ශ ෂ ස ජ ර ල ව
(4) ය ර ල ව ශ ෂ ස
(5) ඛ ඡ ඨ ථ ඵ භ ධ (......)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) ව්‍යශනය, ප්‍රතීශක්තීකරණය, අවධානම, ප්‍රතමාධාර, ආනිශංස
(2) ව්‍යසනය, ප්‍රතිශක්තිකරණය, අවදානම, ප්‍රථමාධාර, ආනිශංස
(3) ව්‍යසනය, ප්‍රතිශක්තිකරණය, අවදානම, ප්‍රථමාධාර, ආනිසංස
(4) ව්‍යසණය, ප්‍රතිශක්තීකරණය, අවධාණම, ප්‍රථමාදාර, ආනිෂංස
(5) ව්‍යසනය, ප්‍රතීශක්තීකරණය, අවදානම, ප්‍රතමාධාර, ආනිසංශ (......)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) අවලක්ෂණ, මාර්ගෝපදේශ, පරිෂ්කාර, උපකරණ, කම්පනය
(2) මාර්ගෝපදේශ, පරිෂ්කාර, අවලක්ෂණ, උපකරණ, කම්පනය
(3) කම්පනය, අවලක්ෂණ, උපකරණ, පරිෂ්කාර, මාර්ගෝපදේශ
(4) පරිෂ්කාර, කම්පනය, මාර්ගෝපදේශ, උපකරණ, අවලක්ෂණ
(5) අවලක්ෂණ, උපකරණ, කම්පනය, පරිෂ්කාර, මාර්ගෝපදේශ (......)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සිංහල වර්ණමාලාවේ සඤ්ඤක අක්ෂර දහයක් ඇත.
(2) සඤ්ඤක සහ නාසික්‍ය අක්ෂර යනු එක ම අක්ෂර වර්ගයකි.
(3) වචනයක ආරම්භයේ සඤ්ඤක අක්ෂර නො යෙදේ.
(4) සඤ්ඤක අක්ෂර වචනයක මැද යෙදිය නො හැකි ය.
(5) සඤ්ඤක අක්ෂර සඳහා මහාප්‍රාණ අක්ෂර යන්න ද යෙදේ. (......)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) දුර්නමග, අර්ධසුඛෝපභෝගී, දන්ත වෛද්‍ය, පිරිසිදු චේතනා
(2) පශ්චාත් කාලීන, අර්ධකාලීන, සර්වකාලීන, මැදකාලීන
(3) ශබ්ද පූජා, ධාවන පථය, ඉන්ද්‍රිය ගෝචර, තාප බලාගාරය
(4) දූෂණ මර්දන, ලක්වැසි ජනතාව, භව චක්‍රය, ඉක්මන් ගමන්
(5) සමූල ඝාතන, යුද්ධ අපරාධ, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර (......)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) සුගන්ධ, අග්නි, මාරුත, දුර්ලභ (2) විෂ්ණු, ඉන්ද්‍ර, මෙහෙසුරු, නාථ
(3) අනල්ප, බොහෝ, ප්‍රතිකාර, ශ්‍රම (4) විනිසුරු, දනිසුරු, සුහුරු, නිසයුරු
(5) අර්ධ, භාග, පූර්ණ, සුළු (......)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) වචන, නයන, බරණ, මරණ (2) ඇස්, ඉස්, මස්, ලේ
(3) විදුරු, ඇඳුරු, ගැඹුරු, රුධිර (4) කැලණි, ධරණි, පෝෂණ, භූෂණ
(5) අද, ඊයේ, මැදියම, රාත්‍රි (......)

1.8 විශේෂණ, අව්‍යය, විභක්ති, දකාරාර්ථ යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) රැදවල්, සුරාසොඬ, අනුපිළිවෙළ, සුවඳමල්
(2) සුවඳමල්, සුරාසොඬ, අනුපිළිවෙළ, රැදවල්
(3) අනුපිළිවෙළ, සුවඳමල්, රැදවල්, සුරාසොඬ
(4) සුවඳමල්, අනුපිළිවෙළ, සුරාසොඬ, රැදවල්
(5) සුරාසොඬ, රැදවල්, සුවඳමල්, අනුපිළිවෙළ (......)

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) පළ, මළ, දළ, හළ (2) වැතිරෙන, පැතිරෙන, ඉතිරෙන, විසිරෙන
(3) නෙළු, හෙළු, පෙළු, තැළු (4) වැටීම්, සීරීම්, පිපුම්, නැසුම්
(5) ගනු, කනු, දෙනු, එනු (......)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "රහසත් පවි නො **කොට**"
(ආ) "**කියමින්** මේ ලෙසට"
(ඉ) "එසේ **උවහොත්** හිමි"
(ඊ) "**කියනු** කිම මහිමා"

(1) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, භාව ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, භාව ක්‍රියා
(3) භාව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, භාව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
(5) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, භාව ක්‍රියා, පූර්ව ක්‍රියා (........)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) බලවත්, කුලවත්, පුවත්, තෙදවත්
(2) සාකල්‍ය, ප්‍රාබල්‍ය, සාළු්‍ය, කෞශල්‍ය
(3) ඉහටි, පහටි, ඉඟටි, කරටි
(4) මධුරතර, සුන්දරතර, ශ්‍රේෂ්ඨතර, වෘද්ධතර
(5) ඇදුරාණ, ඇමැත්තාණ, බමුණාණ, සොයුරාණ (........)

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පෙළිය තෝරන්න.
(1) නිර්ධන, නිර්මල, නිර්ලෝභී, නිරහංකාර
(2) ප්‍රබල, ප්‍රවර, ප්‍රබුද්ධ, ප්‍රබන්ධ
(3) අවපැහැ, අවනම්බු, අවසිහි, අවතඩු
(4) දුර්මත, දුර්ලබ්ධි, දුර්ගුණ, දුර්දාන්ත
(5) දුසිරිත්, දුරුතු, දුලබ, දුදන (........)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) එම්බා, එම්බල, කොල, ඔයි (2) සහ, හා, අවර, සමග
(3) ඇයි, කෙසේ ද, මොක ද, මන්ද (4) අයුරු, විලස, මෙන්, වගේ
(5) නැවත, යළි, පැසුළු, ඉක්බිති (........)

1.14 "**විනිසකරු** නැගූ **තර්කානුකූල** ප්‍රශ්නය නීතිඥයාගේ **ඔදවත්** බව සින්දේ ය" යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, සමාස, තද්ධිත
(2) සමාස, තද්ධිත, සන්ධි
(3) තද්ධිත, සමාස, සන්ධි
(4) සමාස, සන්ධි, තද්ධිත
(5) තද්ධිත, සන්ධි, සමාස (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) සිතුවේ ය, නැටුවේ ය, බැලුවෝ ය, තැළුවේ ය
(2) අඳිනු, වසනු, සොයනු, ලියන්න
(3) වැටිණි, පෙතිණි, දැක්විණි, බැබළිණි
(4) සෑ, නෑ, පෑ, කා
(5) වදාරා, විචාරා, මතුරා, වගුරා (......)

1.16 සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සුනිල්, සුසිල්, සුරල්, සුපුල්
(2) නිදොස්, නිදුක්, නිවහල්, නිබොරු
(3) කොස්පොල්, පොත්පැන්, ඇඳපුටු, අතපය
(4) දෙලොව, දසදිසා, සිවුදෙස, සත්සයුර
(5) ඇද්දළ, කොට්දත්, රිළානැටුම්, මීවද (......)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මරණාසන්න, ස්වර්ගාරෝහණ, මාර්ගෝපදේශ, ශරණාගත
(2) සිතැති, විකුමැති, පවැති, පලැති
(3) සෝපහාස, සෝදාහරණ, සහෝදර, ස්වෝත්සාහී
(4) වළංකඳ, සුළංකපොල්ල, ගංවතුර, දුංකොළ
(5) සුරේන්ද්‍ර, පඤ්චේන්ද්‍රිය, ධනේශ්වර, මහීශ්වර (......)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය කුමක් ද?
(1) වන්දිත, වින්දිත, නන්දිත, බන්ධිත
(2) පන්දහස, පන්සිල්, පන්සිය, පන්සාළිස්
(3) තිදොර, තිලකුණු, තිමද, තිලොව
(4) රැකුම්, දැකුම්, මැකුම්, තැකුම්
(5) සුමධුර, සුන්දර, සුධවල, සුප්‍රකට (......)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.
(1) මා තනතුරු ලෝභයෙන් කටයුතු කරති' යි නො සිතන්න.
(2) දරුවන් ද දැරියන් ද වැවෙහි පීනන්නෝ ය.
(3) නළුවා හෝ නිළිය සභා ගර්භයට පිවිසුණේ ය.
(4) වැස්ස වසිද්දී ම දරුවෝ පාසලට පැමිණ ඇත.
(5) ආගම දහමට හිතැති නායකයකු ජනිත වේවා! (......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.
(1) සමහරු හොර-බොරු, වඤ්චා කර කර ජීවත් වෙනවා.
(2) අවුරුද්දට නැන්ද-මාම බලන්න යන්න ඕන.
(3) ගැමියා ගොවිතැන් බත් කරමින් තම ජීවිකාව සරි කර ගන්නවා.
(4) වාසියට හෝයියා කිම සමහරුන්ගේ සිරිත යි.
(5) රටක වැසියන් සමගියෙන් ජීවත් විය යුතු ය. (......)

(ලකුණු 20 යි.)

※※

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

# අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2023 (2024)

## II පත්‍රය

| විෂය අංකය<br>பாட இலக்கம் | 71 | විෂයය<br>பாடம் | සිංහල |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I කොටස

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|
| 01. | 2 | 11. | 1 |
| 02. | 3 | 12. | 5 |
| 03. | 5 | 13. | 2 |
| 04. | 3 | 14. | 4 |
| 05. | 3 | 15. | 5 |
| 06. | 1 | 16. | 1 |
| 07. | 2 | 17. | 3 |
| 08. | 4 | 18. | 5 |
| 09. | 1 | 19. | 1 |
| 10. | 2 | 20. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீத

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 2

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න සතරකට පමණක් පිළිතුරු සපයන්න.

**2.** **(අ)** පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිසා වූ කලි ශාරීරික හැඩය හා සමාජීය උරුමය අතින් අන්‍ය සත්ත්වයන්ට වෙනස් ස්වරූපයක් ගන්නා බව කිව යුතු යි. අප ලබන සමාජීය උරුමය සංස්කෘතිය වශයෙන් සඳහන් කළ හැකි ය. එනැ ම කෙනෙකුගේ ජීවිත ඉතිහාසය වනාහි, ස්වකීය සමාජ පරිසරයේ සම්ප්‍රදායානුකූල ව පැවත ආ ගති පැවතුම්, සිරිත් විරිත් ආදිය තම ජීවන පිළිවෙළට ඇබ්බැහි කර ගැනීමේ මූලික ක්‍රියාමාර්ගයක් හැටියට දැක්විය හැකි ය. යම් කෙනෙකු කිසියම් සමාජයක උපන් මොහොතේ සිට, ඒ සමාජයේ සිරිත් විරිත් හා අදහස් උදහස් ආදිය ඔහුගේ අද්දැකීම් හා ගති පැවතුම් කෙරෙහි මහත් සේ බල පාන බව කිව යුතු යි.

මේ සමාජ සංස්කෘතිය විවිධ අංගයන්ගෙන් සමන්විත වූවකි. අප පැරැණියන්ගෙන් ලබා ඇති බඩුමුට්ටු, ද්‍රව්‍ය, ක්‍රම, න්‍යාය, අදහස් උදහස්, ගති පැවතුම්, භාෂා, කලා ශිල්ප, ගොඩනැගිලි, ජාතික අගයයන් ආදිය එයට ඇතුළත් වෙයි. මේවා වූ කලි සංස්කෘතික අත්පත් කර ගැනීම්වල බාහිර මූර්තීන් හැටියට පිළිගත යුතු යි. කිසියම් මනුෂ්‍ය වර්ගයකගේ සංස්කෘතික දියුණුව සමාජයට විදහා දක්වන්නේ මේ මූර්තීන් බව කිව යුතු යි. අනුරාධපුරය, පොළොන්නරුව ආදි ස්ථානයන්හි ඇති ථූප, පිළිම, ගොඩනැගිලි, කලාකෘති ආදි නිර්මාණ සිංහල වර්ගයාගේ පැරණි සංස්කෘතික දියුණුව ලොවට විදහා දක්වන සංකේත වේ. මේ භෞතික සංස්කෘතිය අපේ වර්තමාන හා අනාගත පරපුර හැඩ ගැස්වීම සම්බන්ධයෙන් ආධාර කර ගත යුතු වැදගත් ජාතික සම්පතක් වශයෙන් සැලකිය යුතු යි. ඒ නිසා අපේ මේ පැරණි ජාතික සංස්කෘතිය පිළිබඳ සෑහෙන මනා අවබෝධයක් බාල පරම්පරාව කෙරෙහි ඇති කර ලීම වැඩිහිටි ගුරු දෙගුරුන් කෙරෙහි පැවරී ඇති මහත් ජාතික වගකීමකි. අධ්‍යාපන කාර්යයේ දී, දරුවා, ඔහුගේ ජාතික සංස්කෘතිය, සමාජ පරිසරය යන මේ සියල්ලක් ම හා සමග දැඩි සේ අන්‍යෝන්‍ය සම්බන්ධයකින් වෙළී ඇති බව මෙනෙහි කළ යුතු යි. මෙලෙසින් සලකන කල අධ්‍යාපන කාර්යය පැහැදිලි වශයෙන් ම සංස්කෘතික කාර්ය මාර්ගයක් හැටියට පෙනී යනු ඇත. මේ කාර්යය වූ කලි අවස්ථා හෙවත් අංග තුනකින් සමන්විත වූවක් හැටියට දැක්වීමට පුළුවන. එනම්, සංස්කෘතික සංරක්ෂණය, පරිග්‍රහණය හා සංස්කරණය යි. මෙයින්, පරිග්‍රහණය හෙවත් ජාතික සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් හා ඇල්මක් දරුවා කෙරෙහි ඇති කරවීම විශේෂයෙන් ම වැදගත් ය. මේ කාර්යය ඉටු කර ලීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති සමාජ සංස්ථාවන් අතුරෙන් ඉතාමත් ම වැදගත් සංස්ථාව පාසල යි. සංස්කෘතියක් වූ කලි කලින් කලට වෙනස් වනසුලු දෙයකි. එහෙයින්, සංස්කෘතික සංස්කරණය කෙරෙහි ද සමාජයේ හිත යොමු කර ලිය යුතු ය. ඒ සමග ම ස්වකීය ජාතික සංස්කෘතිය කෙරෙහි අන්ධ වූ භක්තියකින් විරූපී වූ දර්ශනයකින් නොබැලීමට හැම කෙනෙකු විසින් ම වග බලා ගත යුතු වන්නේ ය.

(i) පුද්ගලයෙකුගේ ජීවිත ඉතිහාසය ලේඛකයා විසින් අර්ථකථනය කරනු ලැබ ඇත්තේ කෙසේ ද?
(ii) වැදගත් ජාතික සම්පතක් වශයෙන් මෙහි සැලකෙන්නේ කුමක් ද?
(iii) සංස්කෘතික සංස්කරණය කෙරෙහි අවධානය යොමු කළ යුතු වන්නේ කුමක් නිසා ද?
(iv) කිසියම් මනුෂ්‍ය වර්ගයකගේ සංස්කෘතික දියුණුව සමාජයට විදහා දක්වන්නේ කවරක් මගින් ද?
(v) වැඩිහිටි ගුරු දෙගුරුන් කෙරෙහි පැවරී ඇති ජාතික වගකීම කුමක් ද?
(vi) සංස්කෘතික පරිග්‍රහණය පිළිබඳ අවබෝධයක් ඇති කරවීමට පිහිටුවා ඇති සමාජ සංස්ථාව කුමක් ද?

(ලකුණු 02 × 6 = 12 යි.)

(2) (අ)

(i) ස්වකීය සමාජ පරිසරයේ සම්ප්‍රදායානුකූල ව පැවත ආ ගති පැවතුම්, සිරිත් විරිත් ආදිය තම ජීවන පිළිවෙළට ඇබ්බැහි කර ගැනීමේ මූලික ක්‍රියාමාර්ගයක් ලෙස

(ii) භෞතික සංස්කෘතිය

(iii) සංස්කෘතිය කලින් කලට වෙනස් වනසුලු දෙයක් වීම නිසා

(iv) සංස්කෘතික අත්පත් කර ගැනීම්වල බාහිර මූර්ති මගින් / බඩුමුට්ටු , ද්‍රව්‍ය ,ක්‍රම ආදි මූර්ති(බාහිර මූර්ති) මගින්

(v) පැරණි ජාතික සංස්කෘතිය පිළිබඳ මනා අවබෝධයක් බාල පරම්පරාව තුළ ඇති කර ලීම

(vi) පාසල

(ලකුණු 02 x 06 = 12 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ** වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

> ව්‍යාපාරයක් යනුවෙන් අදහස් කෙරෙන්නේ කිසියම් සමාජයක වෙසෙන මානව ප්‍රජාවට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා සපයමින් ලාභයක් ඉපැයීමේ අරමුණු සහිත ව පිහිටුවා ගැනෙන ආයතනයක් හැකහොත් කණ්ඩායමකි. ව්‍යාපාරයක ඉලක්කගත පිරිස හෙවත් කණ්ඩායම වන්නේ පාරිභෝගිකයෝ ය. ව්‍යාපාරයක් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරන්නේ අදියර දෙකකිනි. ඉන් එකක් වන්නේ පාරිභෝගිකයන්ගේ කෙටිකාලීන අවශ්‍යතා ඉටු කිරීම ය. අනෙක වන්නේ පාරිභෝගිකයන්ගේ දීර්ඝකාලීන අවශ්‍යතා ඉටු කිරීම ය. මේ ව්‍යාපාර එකකට එකක් වෙනස් ස්වරූප ගනී. ඒ වෙනස් ස්වරූප හට ගැනෙන්නේ ව්‍යාපාරය විසින් පාරිභෝගික පිරිස හෙවත් ඉලක්කගත කණ්ඩායම සඳහා සපයනු ලබන භාණ්ඩ හා සේවා පදනම් කොට ගෙන ය. සන්නිවේදනය යනු ව්‍යාපාරයක් හා අත්‍යන්තයෙන් ම සම්බන්ධ වන තවත් සංරචකයකි. ව්‍යාපාරයක් විසින් ඊකීය ඉලක්කගත කණ්ඩායම වෙත තම ව්‍යාපාරයේ භාණ්ඩ හෝ සේවා හෝ පිළිබඳ ව දැනුවත් කිරීමට යොදා ගනු ලබන්නේ සන්නිවේදනයේ ප්‍රමුඛාංගයක් වන වෙළෙඳ දැන්වීම ය. පාරිභෝගිකයන් ද තමාට අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් පවතින ව්‍යාපාරික ආයතන පිළිබඳ ව දැනුවත් වන්නේ වෙළෙඳ දැන්වීම් ඔස්සේ ය.
>
> ව්‍යාපාර ආයතනයක පැවැත්ම සඳහා විධිමත් වූ ද සංවිධානාත්මක වූ ද සන්නිවේදන ක්‍රමෝපාය අවශ්‍ය වේ. සන්නිවේදන ක්‍රමෝපාය නිර්මාණය විය යුතු වන්නේ එක් එක් ආයතනයේ අනන්‍යතාව ප්‍රකාශ වන ආකාරයට ය. එමගින් පාරිභෝගිකයන්ගේ ඉල්ලුම හා භාණ්ඩ හා සේවා සම්බන්ධ චර්යාවන් සකස් කෙරෙයි. ව්‍යාපාරික ආයතනයට ඉහළ ලාභයක් උපයා ගැනීමට ද අවකාශ සැලසෙයි. ඇතැම් වෙළෙඳ ව්‍යාපාරවල භාණ්ඩ හා සේවා පිළිබඳ ව පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා සකසා ඇති වෙළෙඳ දැන්වීම් ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඇතැම් පාර්ශ්වවලට හානිකර අන්දමින් නිර්මාණය වී තිබේ. එබැවින් ව්‍යාපාරික ආයතන ස්වකීය වෙළෙඳ දැන්වීම් නිර්මාණය කිරීමේ දී මෙරට සංස්කෘතියට හානිකර නොවන ආකාරයටත් පාරිභෝගිකයා නොමග නොයවන ආකාරයටත් ඒවා නිර්මාණය කළ යුතු ය.

(ලකුණු 13 යි.)

(ආ)

- ව්‍යාපාර හැඳින්වීම සහ ඒවායේ ස්වරූපය
- ව්‍යාපාර සහ සන්නිවේදනය අතර සම්බන්ධතා
- සන්නිවේදනය සකස් විය යුතු ආකාරය
- වෙළෙඳ දැන්වීම් සැකසීමේ දී සංස්කෘතියට හානිකර නො විය යුතු බව

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇති නම්, සමස්තයෙන් ලකුණු දෙකක් අඩු වේ. වචන සංඛ්‍යාව 75-85 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම්, වචන ප්‍රමාණයට නියමිත ලකුණු 2 අඩු වේ.

| | |
|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | - ලකුණු 02 යි. |
| භාෂා නිරවද්‍යතාවට | - ලකුණු 03 යි. |
| අන්තර්ගතයට | - ලකුණු 08 යි. (එක කරුණකට ල. 2 බැගින් කරුණු 4) |

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) බුද්ධි ගලනය හා ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග

(ii) ලෝක බලවතුන්ගේ යුද ගැටුම් හමුවේ පීඩාවට පත් වන ළමා පරපුර

(iii) ශ්‍රී ලංකාවට කෘත්‍රිම බුද්ධිය (AI - Artificial Intelligence) හඳුන්වා දීමේ යෝග්‍ය/අයෝග්‍යතාව

(iv) පොතපත කියවීමේ රුචිය මෙරට තරුණ ප්‍රජාව අතර නගා සිටුවීමට භාවිත කළ හැකි ක්‍රමෝපාය

(v) වැසි ජලය සංරක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ සාම්ප්‍රදායික ජල සංරක්ෂණ විධික්‍රමවලින් ලැබිය හැකි පිටිවහල

(ලකුණු 25 යි.)

**වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

★ විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

(ලකුණු 25)

**4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.**

**(i) ලේඛකයා හෝ ලේඛිකාව පොතක් රචනා කරන්නේ ය.**
**(ii) නැන්දා ද මාමා ද මල්ලී ද මම ද උත්සවයට යන්නෙමි.**
**(iii) ගුණපාල නම් ගොවියා මම ය.**
**(iv) අනාගත නායකයන් රටට හිතැත්තෝ වෙත්වා!**
**(v) අධිෂ්ඨානශීලීහු ජයග්‍රාහකයෝ වෙති.**

04. (අ)

(i) ලේඛකයා හෝ ලේඛිකාව පොතක් රචනා කරන්නී ය.
(ii) නැන්දා ද මාමා ද මල්ලී ද මම ද උත්සවයට යන්නෙමු.
(iii) නිවැරදි යි.
(iv) අනාගත නායකයෝ රටට හිතැත්තෝ වෙත්වා!
(v) නිවැරදි යි.

(ලකුණු 01 x 5 = 05 යි.)

**(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.**

**(i) අමාත්‍යාංශ නිලධාරීහු සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළහ.**
**(ii) ව්‍යාකරණඥයෝ වාක්‍ය රීතීන් උල්ලංඝනය නො කරති.**
**(iii) ගුරුවරු ශිෂ්‍යයන් ලවා අභ්‍යාස ලියවති.**
**(iv) තරග තීරකයෝ දෙවෙනි වටය සඳහා තොප තෝරා ගත්හ.**
**(v) අගමැතිනිය එකී සමුළුවට නියෝජිතවරියක යැව්වා ය.**

(ආ)

(i) අමාත්‍යාංශ නිලධාරීන් විසින් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කැරිණි/ කෙරිණි/කරන ලදි/ කරන ලද්දේ ය/කරනු ලැබී ය/ලැබිණි/ලැබුවේ ය/ලැබුණේ ය/ කෙරුණේ ය.

(ii) ව්‍යාකරණඥයන් විසින් වාක්‍ය රීතීහු උල්ලංඝනය නො කෙරෙති/කෙරෙත්/කරනු ලබති/ කරනු ලබත්/ලැබෙත්/ලැබෙති.

(iii) ගුරුවරුන් විසින් ශිෂ්‍යයන් ලවා අභ්‍යාස ලියැවෙයි (ලියැවේ. ) /ලියවනු ලබයි /ලියවනු ලැබෙයි/ ලියවනු ලැබේ.

(iv) තරග තීරකයන් විසින් දෙවෙනි වටය සඳහා තොපි තෝරා ගැනුණහු ( ගැනුණෙහු) /ගනු ලැබූහු/ ගන්නා ලද්දෙහු/ ගන්නා ලදහු / ගනු ලැබුවහු /ලැබුවෙහු/ ගනු ලැබුණහු/ ලැබුණෙහු.

(v) අගමැතිනිය විසින් එකී සමුළුවට නියෝජිතවරියක් යවන ලද්දී ය/යවනු ලැබුවා ය/යවනු ලැබුණා ය.

(පැරණි සම්ප්‍රදායට අනුව 'යැවුණු , යැවුණාහ, යවන ලදූ , යවන ලදහ' යන රූප ඇත ද ලකුණු ප්‍රදානය කරන්න.)

(ලකුණු 01 x 5 = 05 යි.)

**(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.**

**(i) (කෙනෙක්/කෙනකු) පුරන් වූ කුඹුරු ඉඩම් (අස්වද්දති/අස්වද්දයි).**

**(ii) මාර්ටින් වික්‍රමසිංහ (සූරීන්/සූරීහු) ගම්පෙරළිය රචනා (කළහ/කළේ ය).**

**(iii) දක්ෂ (දරුවන්/දරුවෝ) රට හැර යද්දී (දේශමාමකයෝ/දේශමාමකයන්) කඳුළු සලති.**

**(iv) ප්‍රකට (නාට්‍යකරුවකු/නාට්‍යකරුවෙක්) වූ ජැක්සන් ඇන්තනි චතුර (නිවේදකයෙක්/නිවේදකයකු) ද වූයේ ය.**

**(v) (අපි/අප) දිස්ත්‍රික් තරගයෙන් ජයග්‍රහණය (කරාවි/කරති).**

**(ලකුණු 05 × 3 =15 යි.)**

(ඉ)

(i) කෙනෙක් - අස්වද්දති

(ii) සූරීහු - කළහ

(iii) දරුවන් - දේශමාමකයෝ

(vi) නාට්‍යකරුවකු - නිවේදකයෙක්

(v) අප - කරාවි

(ලකුණු 01 x 5 = 05 යි.)

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. **ඒවායෙහි අනු-අංගය** දක්වන්න.

(i) **අධිකතර** ආශාවෙන් **පෙළෙන** මිනිස්සු **තෘෂ්ණාධිකයෝ** ය.
**(අධිකතර** - තද්ධිත, **පෙළෙන** - කෘදන්ත, **තෘෂ්ණාධිකයෝ** - සන්ධි)

(ii) **මඳපවන්** වැද ලෙලෙන පහන්සිලු **මෙන්** රඟන **වරඟනන්**
**(මඳපවන්** - සමාස, **මෙන්** - නිපාත, **වරඟනන්** - සන්ධි)

(iii) **ප්‍රබල** රාජ්‍යයන්හි **නායකයෝ** ද ස්වාභාවික විපත්තිවලට මුහුණ **දී** සසල වෙති.
**(ප්‍රබල** - උපසර්ග, **නායකයෝ** - විභක්ති, **දී** - ක්‍රියා)

(iv) **අනෞචිත්‍යය** තරම් **කාව්‍යරසය** විනාශ වීමට හේතු වන කාරණයක් නැත්තේ **ම** ය.
**(අනෞචිත්‍යය** - සමාස, **කාව්‍යරසය** - සමාස, **ම** - නිපාත)

(v) **ළමුන්ගේ** අයිතීන් **සුරකිනුව විධිමත්** ක්‍රියාමාර්ග ගෙන ඇත.
**(ළමුන්ගේ** - විභක්ති, **සුරකිනුව** - ක්‍රියා , **විධිමත්** - තද්ධිත)

(ලකුණු 03 × 5 =15 යි.)

05.

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|
| i අධිකතර | තද්ධිත | තුලනාර්ථය / අධිකාර්ථය/ වඩා යන අර්ථය/ අතිශයාර්ථය |
| පෙළෙන | කෘදන්ත | වර්තමාන කෘදන්ත/ වර්තමාන කාල කර්තෘකාරක කෘදන්ත |
| තෘෂ්ණාධිකයෝ | සන්ධි | සමාන ස්වර දීර්ඝ / ස්වර දීර්ඝ/සවර්ණ ස්වර දීර්ඝ / සවර්ණ දීර්ඝ |
| ii මඳපවන් | සමාස | විශේෂණ සමාස/ විශේෂණ පූර්ව පද සමාසය / වෙසෙසුන් සමස් |
| මෙන් | නිපාත | උපමාවාචී/තුල්‍යාර්ථ/උපමාද්‍යෝතක/සමානාර්ථය |
| වරඟනන් | සන්ධි | පරස්වරලෝප සන්ධිය /පරසර ලොප් සඳ |
| iii ප්‍රබල | උපසර්ග | භූෂණාර්ථය/අර්ථය වැඩි කිරීම/ උද්දීපනාර්ථය / උත්කෘෂ්ටාර්ථය |
| නායකයෝ | විභක්ති | ප්‍රථමා විභක්තිය /පෙර විබත |
| දී | ක්‍රියා | පූර්ව ක්‍රියා/පෙර කිරිය |
| iv අනෞචිත්‍යය | සමාස | අව්‍යය සමාස /අවිය සමස් |
| කව්‍යරසය | සමාස | විභක්ති සමාසය /විබත් සමස්/ සම්බන්ධ විභක්ති සමාස/ සබඳ විබත් සමස් |
| ම | නිපාත | අවධාරණාර්ථය |
| v ළමුන්ගේ | විභක්ති | සම්බන්ධ විභක්ති /සබඳ විබත් |
| සුරකිනුව | ක්‍රියා | අපර ක්‍රියා |
| විධිමත් | තද්ධිත | අස්ත්‍යර්ථය /ඇත යන අර්ථය |

(ලකුණු 3x 5=15 යි.)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) මානව ...................... සංවර්ධනයට මග පෙන්වීම ආගමික නායකයන්ගේ කාර්යභාරයකි.

(ii) ...................... දෙපස පිහිටි මුඩුක්කු ගෙවල් පෙළ ජලයෙන් යට වූයේ ය.

(iii) ...................... සංචාරයකින් පසු ඒ මහා නෞකාව වරාය වෙත සේන්දු විය.

(iv) මුතු වන් සුදු වැලි තලාවෙන් ...................... තීරය ශෝභා සම්පන්න විය.

(v) රංගන ක්ෂේත්‍රයෙහි ...................... කලක් රැඳී සිටීමට ඈ සමත් වූවා ය.

(vi) උතුම් ...................... රැකගත් දරුවා ගුරු ඔවදන් ගෞරවයෙන් පිළිපදියි.

(දිගු, ගුණධර්ම, දීර්ඝ, ගංගා, ගුණදහම්, ගඟ)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(අ)

i. ගුණධර්ම

ii. ගඟ

iii. දීර්ඝ

iv. ගංගා

v. දිගු

vi. ගුණදහම්

(ලකුණු 1/2 x 6=3 යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) අත් + දෙක    (ii) මුව + අගින්    (iii) වල් + අම්බලම

(iv) නඳුන් + උයන    (v) වස්තු + උපමා    (vi) රංග + අවතරණය

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ)

i. අද්දෙක

ii. මුවගින්

iii. වල්ලම්බලම

iv. නඳුනුයන

v. වස්තූපමා

vi. රංගාවතරණය

(ලකුණු 1/2 x 6=3 යි.)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **ගොපල්ලා කෙවිටෙන්** ගොනාට පහර දුන්නේ ය.

(ii) **මගීය**, වහා **මාර්ගයෙන්** ඉවත් වනු.

(iii) මම **වැවෙහි** පිපී තිබුණු **නෙලුම්මල්** කැඩුවෙමි.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ)

i. ප්‍රථමා විභක්තිය (පෙර විබත) - කරණ විභක්තිය (කරණ විබත)

ii. ආලපන විභක්තිය (අලප් විබත) - අවධි විභක්තිය (අවදි විබත) [illegible]

iii. ආධාර විභක්තිය (අදර විබත්) - කර්ම විභක්තිය (කම් විබත) (ලකුණු 1/2 x 6=3 යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

අහා ඒ ආශ්චර්යවත් රාත්‍රිය මනරම් ය; විචිත්‍රවත් ය ශෝභමාන ය දර්ශනීය ය. ප්‍රධාන ආරාධිතයා මා අසලට පැමිණ සුබ පතා සාහිත්‍ය ත්‍යාගය ද පිරිනමා බැහැර ගියේ ය. මෙවැනි උත්කර්ෂවත් උත්සවයක් කවර කලෙක වී ද

(ලකුණු 1/2 × 6 = 03 යි.)

; [illegible]

(ඊ)

අහා! ඒ ආශ්චර්යවත් රාත්‍රිය මනරම් ය; විචිත්‍රවත් ය; ශෝභමාන ය; දර්ශනීය ය. ප්‍රධාන ආරාධිතයා මා අසලට පැමිණ, සුබ පතා, සාහිත්‍ය ත්‍යාගය ද පිරිනමා බැහැර ගියේ ය. මෙවැනි උත්කර්ෂවත් උත්සවයක් කවර කලෙක වී ද ?

(ලකුණු 1/2 x 6=3 යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "අපි යහළුවන් සමග විදේශ ගත වෙමු"යි තරුණයෝ ප්‍රකාශ කළහ.

(ii) "දරුවනි, හෙට පාසලට නො එන්න"යි ගුරුතුමා පැවසී ය.

(iii) "මම තරගයෙන් ජයග්‍රහණය කරමි"යි අමිල කී ය.

(ලකුණු 01 × 3 = 03 යි.)

(උ)

i. තමන් යහළුවන් සමග විදේශ ගත වන බව තරුණයෝ ප්‍රකාශ කළහ.

ii. දරුවන්ට පසු දින පාසලට නො එන ලෙස ගුරුතුමා පැවසී ය. / ගුරුතුමා දරුවන් අමතා , පසු දින පාසලට නො එන ලෙස පැවසී ය. ( [illegible] )

iii. තමා තරගයෙන් ජයග්‍රහණය කරන බව අමිල කී ය.

[illegible]

(ලකුණු 1 x 3=3 යි.)

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**කැලණිතිස්ස** රාජ්‍ය සමයේ දී මහා සාගරය ගොඩ ගැලීමට පටන් ගත්තේ ය. භීතියට **පත්** වූ රජතුමා ප්‍රධාන උපදේශකයා **කැඳවා** මෙයට කුමක් කළ යුතු දැ යි විමසී ය. රජතුමාගේ **දේවී** නම් වූ එක ම කුමරිය මුහුදට බිලි දිය යුතු බව ඔහුගේ නිගමනය විය. ඒ **කුමරිය** රූමත් ය; ගුණවත් ය; බුද්ධියෙන් පිරිපුන් ය. රජතුමා ඇය කැඳවා මුහුදට බිලි වීමට **කැමති** දැයි විමසුවේ ය. එය ඇසූ කුමරිය "පිය රජතුමනි, රට ජාතිය, ආගම වෙනුවෙන් මම මාගේ ජීවිතය වුව ද පරිත්‍යාග කරමි"යි පැවසුවා ය. ඇයගේ මෙ වදන් ශ්‍රවණය කළ රජතුමා අතිශය ප්‍රීතිමත් භාවයට පත් වූයේ ය. කුමරිය සර්වාභරණයෙන් විභූෂිත **කොට** නැවක නංවා මුහුදට බිලි **කළේ ය.** ආශ්චර්යයකි, මුහුද නිශ්චල වූයේ ය. ජලය ගොඩ ගැලීම නතර විය. මේ නෞකාව ගසා ගෙන ගොස් ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූ රෝහණ දේශයේ කිරින්ද නම් වූ ස්ථානයට ගොඩ ගැසුවේ ය. එකල එහි රාජ්‍ය පාලකයා වූ **කාවන්තිස්ස** ඇය තම අගබිසෝ පදවියෙහි පිහිටවූයේ ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.

(ii) මෙහි ඇති අතීත කෘදන්ත පද **තුනක්** උපුටා දක්වන්න.

(iii) මෙහි තිබෙන අස්ත්‍යර්ථයේ තද්ධිත පද **තුනක්** උපුටා දක්වන්න.

(iv) දේවී, බුද්ධියෙන්, පිරිපුන් යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(v) මෙහි තිබෙන ඝෝෂ මහාප්‍රාණ අක්ෂර **තුනක්** ලියන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

07.

(i) කළේය, කාවන්තිස්ස, කැඳවා, කැමති, කැලණිතිස්ස, කුමරිය, කොට

(ii) පත් , ඇසූ , කළ, වූ , විභූෂිත

(iii) රූමත්, ගුණවත්, ප්‍රීතිමත්

(iv)

* දේවී - කොම්බුව සහ දීර්ඝත්ව ලක්ෂණය / කොම්බුව සහ හල් කිරීම , දීර්ඝ ඉස්පිල්ල

* බුද්ධියෙන් - කෙටි පාපිල්ල/ කෙටි කොන් පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කොම්බුව

* පිරිපුන් - කෙටි ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල / කෙටි කොන් පාපිල්ල

(iv) ඝ , ධ , භ

(ලකුණු 3x 5=15 යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) සර්ව නාම පද

(ii) සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය

(iii) පූර්ව රූප සන්ධිය

(iv) විධි ක්‍රියාව

(v) ස්වාර්ථයේ තද්ධිත පද

(ලකුණු 05 × 3 =15 යි.)

(මෙහි හැඳින්වීමට ලකුණු 02කි. උදාහරණ සඳහා ලකුණු 03කි.)

08.

i. සර්ව නාම පද

සියලුදෙනා වෙනුවෙන් පොදුවේ ව්‍යවහාරයට ගත හැකි නාම පද විශේෂයක් සර්ව නාම යනුවෙන් හැඳින්වේ. ප්‍රධාන සර්ව නාම කිහිපයක් මෙසේ ය.

"ත" ශබ්දය, "ම" ශබ්දය,"එ" ශබ්දය, "මෙ" ශබ්දය

මීට අමතරව අන්, යම්, ඇතැම් ආදිය ද සර්ව නාම ගණයට ඇතුළත් වේ. ඇතැම් සර්ව නාම පදවල පුරුෂ, වචන, ලිංග භේදය දක්නට ලැබේ.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| උත්තම පුරුෂ | මම | අපි |
| මධ්‍යම පුරුෂ | තෝ, ඔබ, නුඹ, තී | තොපි, ඔබ, නුඹලා |
| ප්‍රථම පුරුෂ | ඔහු, ඈ, හේ, හෙතෙම, එය | ඔවුහු, ඒවා |

ii. සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය

සංඛ්‍යාවාචී පදයක් පූර්ව පදය ලෙස යෙදී පර පදයක් සමග සමාස වන්නේ නම් එය සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය යනුවෙන් හැඳින්වේ.

උදා: දසසිල්

අටලෝදහම

දසපනත

දෙලෝ

තෙරුවන්

iii. පූර්වරූප සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පූර්ව පදයේ අග ඇති ව්‍යඤ්ජන රූපය අපර පදයේ මුල ඇති ව්‍යඤ්ජනයට ද පැමිණවීමෙන් ගළපා ගන්නා සන්ධිය පූර්වරූප සන්ධිය යනුවෙන් හැඳින්වේ.

උදා:

අත් + කම් - අත්තම් ("ක්" යන්න "ත්" යන්නට සමාන වී ඇත)

වත් + කම් - වත්තම්

ඇත් + හල - ඇත්තල

කම් + හල - කම්මල

මිනිස් + හු - මිනිස්සු

32 WWW.PastPapers.WiKi



34 Download O/L, A/L, and Scholarship Past Papers for all subjects

iv. විධි ක්‍රියාව

යම් විධානයක්, නියෝගයක්, අණ කිරීමක් ප්‍රකාශ කිරීම සඳහා යොදනු ලැබන ක්‍රියාව විධි ක්‍රියා යනුවෙන් හැඳින්වේ. විධානය ආදරයෙන් හෝ අනාදරයෙන් හෝ කරන්නක් විය හැකි ය. තමා අභිමුඛයෙහි සිටින අයෙකු සඳහා පමණක් විධානයක් කළ හැකි බැවින් බොහෝ දුරට විධි ක්‍රියාව මධ්‍ය පුරුෂයෙහි පමණක් යෙදේ.

උදා:

1. පුතේ, මෙහෙ එන්න.
2. යන් මත් තොසින් මග සලකුණු නියම දැන
3. කරව පියාසර සකි කොන්තගං තොටින්
4. වරෙවු යමවු නැගිටිවු නො පියවු දෙඇස
5. හිමියනි, මා වෙනුවෙන් ආශිර්වාද කරනු මැනවි.

- විධි ක්‍රියා රූපය පමණක් ලියා තිබීම ලකුණු දීම සඳහා ප්‍රමාණවත් ය.

v. ස්වාර්ථයේ තද්ධිත පද

"එය ම" යන අර්ථය ඇති තද්ධිත ප්‍රත්‍යය සහිත පද ස්වාර්ථයේ තද්ධිත පද යනුවෙන් හැඳින්වේ. අවු, අත්, අස්, ඇටි, ඉ, උ, උතු ආදි ප්‍රත්‍යයයෝ මීට අයත් වෙති.

උදා:

දොර + අවු - දොරවු

සවන් + අත් - සවනත්

වරල් + අස් - වරලස්

පැළ + ඇටි - පැළැටි

බිත් + උ - බිතු

ඇඳි + උතු - ඇඳුතු

**(ලකුණු 05 බැගින් මුළු ලකුණු 5 x 3 = ලකුණු 15 යි.)**

PAST PAPERS WIKI

33 WWW.PastPapers.WiKi


35 Download O/L, A/L, and Scholarship Past Papers for all subjects